# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව

# 2014

# දැක්ම

**ආයුර්වේද, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට පත් වීම.**

# මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආයුර්වේද, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රමවල උන්නතිය සඳහා අවශ්‍ය දැනුම ව්‍යාප්ත කිරීමට සහ වර්ධනය කිරීමට අදාළ වන අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු පැවැත්වීම

# <u>ආයතනයේ සංවිධාන ව්‍යුහය</u>



# අධ්‍යක්ෂතුමියගේ වාර්තාව

2014 වසර සඳහා වූ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව එළිදැක්වීමට ලැබීම පිළිබඳව මා සැබවින්ම ප්‍රීතියට පත්වෙමි. වසර 85ක ඉතිහාසයක් ඇති මෙම ආයතනය 1977 වසරේ සිට විශ්වවිද්‍යාලයට අනුබද්ධ ප්‍රමුඛ ආයතනයකි. වර්තමානයේ දී එමඟින් ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනමනු ලැබේ. ප්‍රවර්තන වසරේ දී ආයුර්වේද වෛද්‍ය හා චිකිත්සක විද්‍යාවේදී (B.A.M.S.) උපාධිය සඳහා ශිෂ්‍යයින් 180 දෙනෙක් බඳවා ගන්නා ලද අතර යුනානි වෛද්‍ය ක්‍රමය හා චිකිත්සක විද්‍යාවේදී (B.U.M.S.) උපාධිය සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍යයින් සංඛ්‍යාව 55කි. මෙය අධ්‍යයන වර්ෂයක් තුළ දී මෙම උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි කරන ලද වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාව වේ. මෙම ආයතනය සහ ඉන්දියාවේ බැරනැස් හින්දු විශ්වවිද්‍යාලය අතර ඇති කර ගන්නා ලද අවබෝධතා ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ආයුර්වේද වෛද්‍ය ශිෂ්‍යත්වලාභීන් විසි දෙනෙක් සඳහා ඔවුන්ගේ කෙටි කාලීන විදේශ සායනික පුහුණුව සම්පූර්ණ කිරීමට අවස්ථාව උදා විය. ශිෂ්‍යයින් තිස්දෙනෙක් සඳහා ආයුර්වේද/ යුනානි වෛද්‍ය ක්‍රම පිළිබඳ පශ්චාත්-උපාධි ඩිප්ලෝමා ප්‍රදානය කරන ලදී. යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව, රූපලාවන්‍ය චිකිත්සාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සහ සම්බාහන චිකිත්සාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව යන පාඨමාලා තුන සඳහා සනාතන සභාවේ අනුමැතිය ලැබී ඇත. ආයුර්වේද සෞඛ්‍ය සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MAyHT) සහ ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සනාතන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම දේශීය වෛද්‍ය ආයතනයේ දී පැවැත්වීය. එමෙන්ම ආයතනයට සැලසුම් කරන ලද ව්‍යාපෘති කීපයක්ම අවසන් කිරීමට හැකි වූ අතර ජපන් ජාතික ශිෂ්‍යයින් සඳහා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් ශාන්ති ලංකා ජාත්‍යන්තර ආයුර්වේද ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ප්‍රායෝගික නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා වූ පහසුකම් වැඩිදියුණු කිරීමේ පදනම සලසනු සඳහා 2014 වසර උපයෝගී කර ගන්නා ලදී. බොරැල්ලේ පිහිටි ජාතික ආයුර්වේද රෝහල සඳහා රුපියල් මිලියන 1.6ක වටිනාකමකින් යුත් වෛද්‍ය උපකරණ ප්‍රදානය කරන ලදී. එමෙන්ම වසර තුළ දී සමාන්තර විද්‍යා අධ්‍යයන අංශයේ, ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශයේ සහ මූලික මූලධර්ම අධ්‍යයන අංශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කරන ලදී. ව්‍යවච්ඡේද විද්‍යා, කායික විද්‍යා සහ ද්‍රව්‍යගුණ නිඝණ්ටු විද්‍යාගාර සඳහා අවශ්‍ය උපකරණ, ආදර්ශ සහ අනුකාරක ලබා දෙන ලදී. ආයුර්වේද සහ යුනානි ඖෂධාගාර නවීකරණ කටයුතු අවසන් කරන ලදී. පරිසර හිතකාමී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් මධ්‍යස්ථාන දෙකක් පිහිටුවන ලදී. ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා ඔවුන්ව බාහිර ආයතන වෙත ප්‍රවාහනය කිරීම සඳහා කුඩා බස් රථයක් මිල දී ගන්නා ලදී. කාන්තා නේවාසිකාගාරයක් ඉදි කිරීම වෙනුවෙන් මොරගස්මුල්ලේ දී අත්තිවාරම් දමන ලද අතර දේශීය වෛද්‍ය ආයතන පරිශ්‍රය තුළ ශිෂ්‍යයින්ගේ සුභසාධනය වෙනුවෙන් වූ නවීන වැසිකිළි කාමර සංකීර්ණයක් නිම කරන ලදී. අවශ්‍ය පහසුකම් ඇතිව දේශන ශාලා නවීකරණය කරන ලද අතර සෑම පන්ති කාමරයක් සඳහාම බහු-මාධ්‍ය පහසුකම් ඇති කරන ලදී. ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ පළමු අදියර ආරම්භ කරන ලදී. ස්වාධීන ඉගෙනුම වැඩිදියුණු කිරීම සඳහා පුස්තකල පොත් හා සඟරා මිල දී ගන්නා ලදී. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා HETC ව්‍යාපෘතියේ මුදල් වෙන් කිරීම් උපයෝගී කර ගන්නා ලදී. ජෛව-රසායනික විශ්ලේෂණ ඒකකයක් ඇති කරන ලද අතර තාක්ෂණික නිලධාරීන් සඳහා ජෛව-රසායනික විශ්ලේෂණය හා විද්‍යාගාර පරිචය පිළිබඳ පුහුණු වැඩමුළු පවත්වන ලදී. ගුරු ශිෂ්‍ය සහභාගීත්වය ඇතිව පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් පැරණි අතින් ලියා ඇති පොත් සංරක්ෂණය කිරීම සඳහා වූ අතින් ලියන ලද අත්පිටපත් සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ආයතනය ශිෂ්‍යයින්ගේ සක්‍රිය සහභාගීත්වය ඇතිව දැයට කිරුළ 2014 ප්‍රදර්ශනයට සහ මහනුවර සිටි සෙන්ටර්හි දී පැවති ජාත්‍යන්තර ආයුර්වේද අධ්‍යාපනික ප්‍රදර්ශනයට සහ ආයුර්වේද-එක්ස්පෝ ප්‍රදර්ශනයට සහභාගී විය. එමෙන්ම 2014 වසර තුළ දී ආයතනයට පර්යේෂණ සංස්කෘතිය සවිබල ගන්වමින් හා දැනුම බෙදා හරිමින් ජාතික පරිසංවාද දෙකක් සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීමට හැකි විය.

මෙම සියලු කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ පරිපාලන, මූල්‍ය, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට මෙන්ම ශිෂ්‍ය ප්‍රජාවට ද මම මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. එමෙන්ම ආයතනයේ සංවර්ධනය වෙනුවෙන් මා හට නිවැරදි මඟ පෙන්වන ලද සනාතන සභාවට සහ කළමනාකාර මණ්ඩලයට ද මම මාගේ ස්තුතිය පුද කරමි. ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා, සභාපති හා උප-සභාපති ඇතුළු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උපකුලපතිතුමා සහ නියෝජ්‍ය උපකුලපතිතුමා ඇතුළු කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ස්ථාවර කමිටුව සහ 2014 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව එළි දැක්වීම වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනයේ කාර්යයන් ඉටු කිරීමට සහාය ලබා දුන් අනෙකුත් සියලුම නිලධාරීන් සඳහා මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**ආචාර්ය එම්. ඩබ්.එස්.ජේ. කුමාරි**

ආචාර්ය (ආයුර්වේද) (ඉන්දියාව), **M.D. (Ayu)** (ඉන්දියාව), **B.A.M.S.** (ගෞරව), පශ්චාත් උපාධි ඩිප්ලෝමා.(අධ්‍යාපන), **D.D.A.M.S., D.H.P. C** (ශ්‍රී ලංකා).
වැඩ බලන අධ්‍යක්ෂ

අන්තර්ගතය පිටු අංකය


**1.** පරිපාලන ව්‍යුහය

1.1 අධ්‍යක්ෂ 1
1.2 කළමනාකාර මණ්ඩලය 1-2
1.3 අධ්‍යයන කමිටු 3
1.3 (1) ආයුර්වේද අංශීය කමිටුව 3
1.3 (2) යුනානි අංශීය කමිටුව 3
1.3 (3) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව (RHDC) 3

**2.** අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන සහ ඒකක

2.1 ආයුර්වේද අංශය යටතේ ඇති අධ්‍යයනාංශ 4
2.2 යුනානි අංශය යටතේ ඇති අධ්‍යයනාංශ 4
2.3 තොරතුරු තාක්ෂණ ඒකකය 4
2.4 පුස්තකාලය

**3.** දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය ගැන දළ විශ්ලේෂණයක්

3.1 උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීම 5-6
3.2 BAMS සහ BUMS උපාධි වැඩසටහන් ගැන විස්තර 7
3.3 ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාව 7
3.4 පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන් 7
3.4.1 පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීම 8
3.5 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර 9
3.6 පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර 10
3.7 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර 10
3.8 2014 දී වැඩමුළු සහ සම්මන්ත්‍රණ 11
3.9 කාර්ය මණ්ඩලය සඳහා නිපුණතා සංවර්ධන පුහුණුව 11
3.10 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන 11
3.11 ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වලදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය 11-13
3:12 ක්‍රියාකාරකම් 13

**4.** ශිෂ්‍ය සුභසාධනය

4.1 මූල්‍ය සහාය 14
4.2 ශිෂ්‍ය නේවාසිකාගාර 14
4.3 ආයතනයේ ශිෂ්‍ය සංගම් 15
4.4 ආයුර්වේද ශික්ෂණ රෝහල 15

**5.** යටිතල පහසුකම් සංවර්ධනය 16

**6.** මූල්‍ය සහ ගිණුම්කරණය පිළිබඳ විස්තර 16-18
6.1 අවසන් ගිණුම් – 2014 19-55
6.2 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 56-68
6.3 විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ වාර්තාව 69-71

# 01. පරිපාලන ව්‍යුහය

## 1.1 අධ්‍යක්ෂතුමිය

ආචාර්ය එම්.ඩබ්ලිව්.එස්.ජේ. කුමාරි මහත්මිය, වර්තමාන අංශ ප්‍රධාන/ආයුර්වේද 2014 වසර තුළ දී කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂතුමිය ලෙස සේවය කළාය. එතුමිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ඉතිහාසය තුළ අධ්‍යක්ෂ ධුරයට පත් වූ පළමු කාන්තාව වේ. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයෙන් පළමු පන්තියේ (ගෞරව) උපාධිය සහ පශ්චාත් උපාධිය හිමිකර ගත් ඇය ඉන්දියාවේ ගුජරාත් ආයුර්වේද විශ්වවිද්‍යාලයෙන් වෛද්‍යවිද්‍යාපති (ආයුර්වේදය) [MD(Ayu)] උපාධියද ඉන්දියාවේ රාජස්තාන ආයුර්වේද විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය [Ph.D Ayu.] ද හිමි කර ගෙන ඇත. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයෙහි වසර 22ක අත්දැකීම් ඇති ඇය මූලික මූලධර්ම අධ්‍යයන අංශයේ ප්‍රධානී වශයෙන් (2001-2003) ද අංශ ප්‍රධානී/ ආයුර්වේද (2004-2006) වශයෙන් ද සේවය කර ඇත. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය සහ ජාත්‍යන්තර සබඳතා වැඩි දියුණු කිරීමට ඇය මෙම කාලය තුළ ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත.

## 1.2 කළමනාකාර මණ්ඩලය

ආයතනයේ කළමනාකාර මණ්ඩලය පත් කොට ඇත්තේ 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියේ 10(1) ඡේදයේ ප්‍රතිපාදනවලට අනුකූලවය. කළමනාකාර මණ්ඩලය අධ්‍යක්ෂවරයෙකු (නිල බලයෙන් සභාපති ලෙස) සහ පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ. එය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වේ.

(අ) අධ්‍යක්ෂවරයා
(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ පත් කළ නාමිකයෙකු
(ඇ) සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ පත් කළ නාමිකයෙකු
(ඈ) ආයුර්වේද කොමසාරිස්
(ඉ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා
(ඊ) මධ්‍යම ආයුර්වේද රෝහලේ වෛද්‍ය අධිකාරිවරයා
(උ) කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති
(ඌ) ආයතනයේ එක් එක් අධ්‍යයනාංශ ප්‍රධානීන්

එසේම පහත සඳහන් පරිදි සාමාජිකයින්ද කළමනාකාර මණ්ඩලයට තෝරා පත් කර ගැනේ.

(අ) කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් එහි සාමාජිකයන් අතරින් තෝරා පත් කර ගත් සාමාජිකයන් තිදෙනෙක්
(ආ) ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ස්වකීය සාමාජිකයන් අතුරින් පත් කර ගත් එක් සාමාජිකයෙකු
(ඇ) සංස්කෘතික, අධ්‍යාපනික, වෘත්තීය හෝ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවාවක් දක්වන ලද පුද්ගලයන් අතුරින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන් අට දෙනෙකු වේ. ඒ අතුරින් පස් දෙනෙකු දේශීය වෛද්‍ය වෘත්තියේ සාමාජිකයන් අතුරින් විය යුතුය.

**<u>කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්</u>**

**අධ්‍යක්ෂ (සභාපති)**

**වැඩ බලන අධ්‍යක්ෂ (සභාපති)**

ආචාර්ය එම්.ඩබ්.එස්.ජේ කුමාරි මෙය

**අංශ ප්‍රධාන/ආයුර්වේද**

ආචාර්ය අයි.ජී.පී.ආර්. කුලනාථ මිය

**අංශ ප්‍රධාන/යුනානි**

ආචාර්ය ඒ.එච්.එම්. මජ්වුඩ්

**අතිරේක ලේකම්/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

පී. ජී. ජයසිංහ මහතා

**අතිරේක ලේකම්/සෞඛ්‍ය අමාත්‍යාංශය**

සෝමරත්න විදානපතිරණ මහතා

**මහාභාණ්ඩාගාර නියෝජිත**

සී.එච්. රණතුංග මෙය/ සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව

**ආයුර්වේද කොමසාරිස්**

පී. එස්. කේ. ආර්. වීරකෝන් මහතා

**අධ්‍යක්ෂ/බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය**

මහාචාර්ය කේ. කේ. ඩී. එස්. රණවීර මහතා

**අධ්‍යක්ෂ/ ආයුර්වේද ශික්ෂණ රෝහල**

ආචාර්ය ධනපාල හෙට්ටිආරච්චි

**පීඨාධිපති - වෛද්‍ය පීඨය**

මහාචාර්ය රොහාන් ඩබ්ලිව්. ජයසේකර මහතා

**වෛද්‍ය පීඨ සාමාජිකයන්**

මහාචාර්ය පී.ආර්. ප්‍රනාන්දු මහතා
වෛද්‍ය පණ්ඩුක කරුණානායක මහතා
වෛද්‍ය ක්‍රිශාන්ත වීරසිංහ මහතා

**ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික**

වෛද්‍ය එස්. එම්. එච්. සේනබණ්ඩා මහතා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කළ සාමාජිකයන්**

මහාචාර්ය එම්.එච්.ජ්. තිසේරා මහතා
ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා

වෛද්‍ය ඒ. එම්. අබුතාහීර් මහතා

ප්‍රේමලාල් රත්නවීර මහතා
ආචාර්ය සී.එල්. ගුරුගේ
වෛද්‍ය ඒ.ඒ.යු.එස්.පී.පී.කේ. අතපත්තු මහතා
ජී.එල්.එස්. සේනාධීර මහතා
වෛද්‍ය එම්.එච්. නිමල් කරුණාසිරි මහතා

**ලේකම් -** වැඩ බලන නියෝජ්‍ය ලේඛකාධිකාරි
අයි.කේ.කේ. විජේකෝන් මිය

## 1.3 අධ්‍යයන කමිටු

### 1.3 (1) ආයුර්වේද අංශීය කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආයුර්වේද අංශයේ අදාළ සියලු අංශවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග සම්බන්ධ සියලු කටයුතු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම අංශීය කමිටුව වෙත පවරා ඇත.

1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියේ 15(1) ඡේදයට අනුකූලව පහත පරිදි 2013 වර්ෂයේදී අංශීය කමිටුව පත් කොට ඇත.

ආයුර්වේද අංශීය කමිටුවේ සභාපති - අංශ ප්‍රධාන / ආයුර්වේද
ආචාර්ය අයි.ජී.පී.ආර්. කුලනාථ මිය

සියලු ස්ථිර කථිකාචාර්යවරුන් අංශීය කමිටුවේ සාමාජිකයන් වේ.

### 1.3 (2) යුනානි අංශීය කමිටුව

යුනානි අංශීය කමිටුවේ සභාපති - අංශ ප්‍රධාන / යුනානි
ආචාර්ය ඒ.එච්.එම්. මව්ජුඩ් මහතා
සියලු ස්ථිර කථිකාචාර්යවරුන් අංශීය කමිටුවේ සාමාජිකයන් වේ.

### 1.3 (3) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව (RHDC)

අධ්‍යක්ෂ (සභාපති)
අතිරේක අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි අංශය
අංශ ප්‍රධාන/ආයුර්වේද
අංශ ප්‍රධාන/යුනානි
ආයතනයේ සියලු මහාචාර්යවරුන් සහ සහාය මහාචාර්යවරුන්
ආයුර්වේද කොමසාරිස්
අධ්‍යක්ෂ - බණ්ඩාරණායක ආයුර්වේද පර්යේෂණ ආයතනය
අධ්‍යක්ෂ - ආයුර්වේද ශික්ෂණ රෝහල
මහාචාර්ය ඩබ්ලිව්. ඩී. රත්නසූරිය මහතා - විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය ස්වර්ණා පියසිරි මහත්මිය -පීඨාධිපති (පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

වෛද්‍ය ක්‍රිශාන්ත වීරසිංහ මහතා - වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

සම්බන්ධීකාරක - MD (ආයුර්වේද) පශ්චාත් උපාධි පාඨමාලාව

සම්බන්ධීකාරක/ආයුර්වේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

සම්බන්ධීකාරක/යුනානි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

නියෝජ්‍ය මූල්‍යාධිකාරි

නියෝජ්‍ය ලේඛකාධිකාරි /ලේකම්

## 2. අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන සහ ඒකක

### 2.1 ආයුර්වේද අංශය යටතේ ඇති අධ්‍යයනාංශ

ආයුර්වේද අංශය නම් වශයෙන් අධ්‍යයනාංශ අටකින් (08) සමන්විත වේ.

I. මෞලික සිද්ධාන්ත
II. ද්‍රව්‍ය ගුණ විඥාන
III. ස්වස්තවෘත්ත
IV. කාය චිකිත්සා
V. දේශීය චිකිත්සා
VI. ප්‍රසූතිතන්ත්‍ර කෞමාරභෘත්‍ය
VII. ශල්‍ය ශාලක්‍ය
VIII. සමාන්තර විද්‍යා

### 2.2 යුනානි අංශය යටතේ ඇති අධ්‍යයනාංශ

යුනානි අංශය නම් වශයෙන් අධ්‍යයනාංශ අටකින් **(08)** සමන්විත වේ.

I. කුල්ලියත්
II. ඉල්මුල් අද්විියා
III. මෞලිජාත්
IV. තිස්වාන් වා කබාලත්
V. ඉල්මුල් ජරහත්
VI. ඉෆ්සාන් ඒ සේහාත්
VII. දේශීය ඉලාජ්
VIII. සමාන්තර විද්‍යා (ආයුර්වේද සහ යුනානි යන අංශ දෙකටම පොදුය)

### 2.3 තොරතුරු තාක්ෂණ ඒකකය

තොරතුරු තාක්ෂණ හා භාෂා විද්‍යාගාරය 2014 වසරේ මාර්තු මස **HETC** ව්‍යාපෘතිය යටතේ පිහිටුවන ලදී. ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පන්ති සඳහා පරිගණක 39ක් ද අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක 16ක් ද මෙම විද්‍යාගාරය තුළ ඇත.

### 2.4 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පුස්තකාලය 1929 වසරේ දී ආයුර්වේද විද්‍යාලය ඇති කිරීමත් සමඟ පිහිටුවන ලදී. ආයතනයේ අධ්‍යාපනික හා පර්යේෂණ වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත් ලබා දෙමින් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වේ. ග්‍රන්ථ එකතුව සඳහා මූලික වශයෙන් ආයුර්වේද හා යුනානි වෛද්‍ය ක්ෂේත්‍ර ඇතුළත් වේ. ප්‍රවර්තන වාර සඟරා එකතුවට මුද්‍රිත අනුවාදයේ දායකත්වය ලබා ඇති සඟරා 21ක් ඇතුළත් වේ.

පුස්තකාල කාර්ය මණ්ඩලයේ විස්තර **- 2014**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | 01 |
| සහකාර පුස්තකාලයාධිපති | 01 |
| ජ්‍යෙෂ්ඨ කාර්ය මාණ්ඩලික සහකාර (පුස්තකාල සේවා) | 01 |
| පුස්තකාල සහායක (ශ්‍රේණිය I) | 02 |
| පුස්තකාල සහායක (ශ්‍රේණිය III) | 03 |
| පුස්තකාල සහකාර (ශ්‍රේණිය II) | 02 |
| කාර්යාල සුළු සේවක | 01 |
| කම්කරු (ශ්‍රේණිය III) | 01 |

අත්පත් කර ගැනීම - පුස්තකාලය සඳහා රුපියල් මිලියන 1046813.00ක් සහ එ.ජ. ඩොලර් 16584ක් වටිනා පොත් සහ වාර සඟරා මිලදී ගන්නා ලදී.

ප්‍රදාන - ප්‍රදාන ලෙස පොත් 131ක් ලැබී ඇත.

තාක්ෂණික සේවා - 2014 වසර තුළදී බැහැර ගෙන යාමේ පොත් 14590ක් සහ විමර්ශන පොත් 3007ක් නිකුත් කර ඇත.

විශේෂ සේවා - වත්මන් දැනුවත් කිරීමේ සේවාව, අන්තර්-පුස්තකාල ණය සේවාව, ඡායාපිටපත් සේවාව සහ අන්තර්ජාල පහසුකම්

පරිශීලකයන් සංඛ්‍යාව - උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් - ආයුර්වේද - 631
- යුනානි - 195

පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් - ඩිප්ලෝමා - 29
- MD (Ayu) - 20

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 68
අනධ්‍යයන කාර්ය මණ්ඩලය - 83

ව්‍යාපෘති: - පුස්තකාල අත්පිටපත් ව්‍යාපෘතිය අවසන් කරන ලදී - I කොටස (ඡායාපිටපත් කිරීම මගින් අත්පිටපත් සංරක්ෂණය කිරීම)

භෞතික වැඩි දියුණු කිරීම - පුස්තකාල ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතිය ආරම්භ කිරීම

## 3. දේශිය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳ දළ විශ්ලේෂණයක්

### 3.1 උපාධි අපේක්ෂකයින්ගේ ප්‍රවේශය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වාර්ෂිකව අ.පො.ස. උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවෙන් සුදුසුකම් ලබන සිසුන් ආයුර්වේද වෛද්‍ය සහ ශල්‍යවේදී (**BAMS**) සහ යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධි (**BUMS**) පාඨමාලා දෙක සඳහා සිසුන් තෝරා ගනු ලැබේ.

මෙම පාඨමාලා **2** සඳහාම දළ වශයෙන් සිසුන් **200** ක පමණ වාර්ෂික ප්‍රවේශයක් සිදු වේ.

2013 වසරේදී අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් **Z** ලකුණුවලට අනුව 2014 දී බඳවා ගන්නා ලදී.

**ශිෂ්‍ය විස්තර - 2014**

| අංශය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම | **1**වන වසර සිසුන් | **1**වන වසර සිසුන් | **2**වන වසර සිසුන් | **3**වන වසර සිසුන් | **4**වන වසර සිසුන් | අවසන් වසර සිසුන් | උපාධිධාරීන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයුර්වේද | BAMS | ඉංග්‍රීසි | 188 (1වන බඳවා ගැනීම) | | 179 | 99 | 135 | 109 | 91 | 14 |
| ආයුර්වේද | BAMS | ඉංග්‍රීසි | 164 (2වන බඳවා ගැනීම) | 147 | | | | | | |
| යුනානි | BUMS | ඉංග්‍රීසි | 57 (1වන බඳවා ගැනීම | | 56 | 49 | 24 | 29 | 28 | -- |
| යුනානි | BUMS | ඉංග්‍රීසි | 75 (2වන බඳවා ගැනීම) | 51 | | | | | | |
| මුළු එකතුව | | | | **198** | **235** | **148** | **159** | **138** | **119** | **14** |

2014 දී ශිෂ්‍ය කණ්ඩායම් දෙකෙහි ලියාපදිංචිය පසුගිය වසරවලට වඩා වැඩි වී ඇත.




## 3.2 BAMS සහ BUMS උපාධි පාඨමාලා පිළිබඳ විස්තර

**(i)** ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය – **(BAMS)**
**(ii)** යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය – **(BUMS)**

මෙම පාඨමාලා වසර පහක **(05)** ආයතනික අධ්‍යයන පුහුණුවකින්ද එක් වර්ෂයක ආධුනික වෛද්‍ය පුහුණුවකින්ද සමන්විත වේ. නව පාඨමාලාවේ ප්‍රධාන දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. දේශන කටයුතු ආයතනය තුළ පවත්වනු ලබන අතර සායනික අධ්‍යයන කටයුතු මූලිකව බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල ආශ්‍රිතව සිදු කෙරේ.

නව අධ්‍යයන පාඨමාලාව සෙමස්තර ක්‍රමය යටතේ සිදු වේ. එක් අධ්‍යයන වසරක් සෙමස්තර දෙකකින් සමන්විත වේ. එක් සෙමස්තරයකට සති **15**ක් ඇතුළත් වේ. සෑම සෙමස්තරයක් අවසානයේම විභාගයක් පැවැත්වේ.

**ආයුර්වේද සහ යුනානි වෛද්‍ය උපාධි පාඨමාලාවල අරමුණු සහ පරමාර්ථ**

**1.** ආයුර්වේද සහ යුනානි වෛද්‍ය ක්‍රම පිළිබඳ වර්තමාන සමාජ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි හසල දැනුමක් හා දක්ෂතා ඇති වෛද්‍යවරුන් බිහි කිරීම.
**2.** මූලික සෞඛ්‍ය සංරක්ෂණයේ වගකීම දැරිය හැකි වීම.
**3.** දේශීය ඖෂධ සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට හැකි වීම.
**4.** යහපත් සෞඛ්‍ය තත්වයක් පවත්වාගෙන යාම සඳහා සරල ඖෂධ හා ප්‍රතිකාර ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් මහජනතාවට ලබා දීමේ හැකියාවක් ජනිත වීම.
**5.** ඉපැරණි වෛද්‍ය ඥානය උද්දීපනය කිරීමේ හැකියාව.
**6.** ආයුර්වේද සහ යුනානි වෛද්‍ය ක්‍රම පිළිබඳ පර්යේෂණ කළ හැකි එමගින් වෛද්‍ය ක්ෂේත්‍රයට නව අත්දැකීම් එක් කළ හැකි උගත් වෛද්‍යවරුන් බිහි කිරීම
**7.** ඉදිරි ආයුර්වේද හා යුනානි වෛද්‍ය ජන සමාජය පුහුණු කිරීමේ වගකීම දැරිය හැකි දක්ෂ ආචාර්යවරුන් බිහි කිරීම
**8.** ආයුර්වේද සහ යුනානි ක්ෂේත්‍රයට අදාළව සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීම

## 3.3 ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (භෛෂජ්ජක පාඨමාලාව)

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය මගින් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා ඉටු කරනු ලබන එක් මහඟු කාර්යයක් සේ මෙම පාඨමාලාව හැඳින්විය හැකිය. රජයේ සහ පුද්ගලික අංශයේ ඖෂධවේදය විධිමත් ලෙස පුහුණු කරන දෙවසරක පාඨමාලාවක් වන මෙමගින් ඔවුන්ට දේශීය ඖෂධ වර්ග හඳුනා ගැනීම ඒවායේ ගුණාත්මකභාවය සහ භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා දීම සිදු කෙරේ.

සතියේ සෙනසුරාදා දිනවල මෙහි න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ලබා දෙන අතර හල්දුම්මුල්ල ජාතික ඔසු උයනේදී ක්ෂේත්‍ර අධ්‍යයන සිදු කෙරේ.

තෙවන ශිෂ්‍ය කණ්ඩායම සඳහා ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2014/2016) 2014 මැයි 31වන දින ආරම්භ කරන ලදී.

## 3.4 පශ්චාත්-උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන්

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පශ්චාත් උපාධි අංශය මඟින් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආධාරය හා කැපවීම සහ අදාළ බාහිර සම්පත් දායකයින්ගේ දායකත්වය ඇතිව පහත දැක්වෙන පශ්චාත්-උපාධි වැඩසටහන් පවත්වනු ලැබේ.

1. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ පශ්චාත්-උපාධි ඩිප්ලෝමාව 2013 / 2014
2. යූනානි වෛද්‍ය ක්‍රමය පිළිබඳ පශ්චාත්-උපාධි ඩිප්ලෝමාව 2013 / 2014
3. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ වෛද්‍යපති උපාධිය සඳහා වූ පශ්චාත්-උපාධි පාඨමාලාව MD (Ayu) 2012/2015

**ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ පශ්චාත්-උපාධි ඩිප්ලෝමාව 2013/2014**

මෙම වැඩසටහන පූර්ණ කාලීන වැඩසටහනක් වන ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ගේ න්‍යායාත්මන හා සායනික/ ප්‍රයෝගික දැනුම වැඩිදියුණු කිරීම සඳහා වූ මාස 15ක අධ්‍යයන වැඩසටහනකි. 2013 වසරේ දී ලියාපදිංචි වූ 5වන ශිෂ්‍ය කණ්ඩායම පශ්චාත්-උපාධි ශිෂ්‍යයින් විසි දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

**යූනානි වෛද්‍ය ක්‍රමය පිළිබඳ පශ්චාත්-උපාධි ඩිප්ලෝමාව 2013/2014**

මෙම අධ්‍යයන වැඩසටහන 2013 වසරේ දී නිල වශයෙන් ආරම්භ කරන ලද අතර පූර්ණ කාලීන පාඨමාලාවකි. වැඩසටහනේ කාල සීමාව මාස 15කි. 2013 වසරේ දී පළමුවැනි ශිෂ්‍ය කණ්ඩායම ලියාපදිංචි කර ගන්නා ලද අතර එම ශිෂ්‍ය සංඛ්‍යාව අටක් විය. යූනානි වෛද්‍යවරුන්ගේ න්‍යායාත්මන හා සායනික/ ප්‍රයෝගික දැනුම වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

තවද, ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ පළාත් සභා යටතේ සේවය කරන වෛද්‍යවරුන් සඳහා ද ඉහත සඳහන් කළ පශ්චාත්-උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සහාය දක්වයි. සමස්ත පාඨමාලා කාලය පුරාවට ඔවුන්ට පූර්ණ වැටුප් සහිත නිවාඩු හිමි වේ. ඔවුන්ගේ රැකියා උසස්වීම් සඳහා පශ්චාත්-උපාධි ඩිප්ලෝමා සුදුසුකමක් ලැබීම අනිවාර්ය වේ.

**ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ වෛද්‍යපති උපාධිය සඳහා වූ පශ්චාත්-උපාධි පාඨමාලාව MD (Ayu)**

ඉහත වැඩසටහන 2012 මැයි මස 21වැනි දින ආරම්භ කරන ලද අතර MD (Ayu) 2012 / 2015 උපාධියේ රීති හා රෙගුලාසි අනුව ශිෂ්‍යයින් 20 දෙනෙක් ලියාපදිංචි කරන ලදී. දහනව වැනි MD (Ayu) ශිෂ්‍යත්වලාභීන් 2014 පෙබරවාරි මස 15 සිට 2014 මැයි මස 15 දක්වා ඉන්දියාවේ බරණැස හින්දු විශ්වවිද්‍යාලයේ මාස 3ක විදේශ පුහුණුවට සහභාගී විය. ඔවුන් 2014 මැයි මස 15වැනි දින ශ්‍රී ලංකාවට පැමිණියේය. ඉන්පසු MD විද්‍යාර්ථීන් කාල සටහනට අනුව සිය අධ්‍යයන කටයුතු කර ගෙන යන ලදී.

### 3.4.1 පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් බඳවා ගැනීම

| වැඩසටහනේ නම | ශිෂ්‍යයන් සංඛ්‍යාව | මාධ්‍යය |
|---|---|---|
| ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 13 | සිංහල |
| ආයුර්වේද පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 22 | ඉංග්‍රීසි |
| යුනානි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 08 | ඉංග්‍රීසි |
| ආයුර්වේද වෛද්‍යපති MD (Ayu) පශ්චාත් උපාධි වැඩසටහන | 20 | ඉංග්‍රීසි |

සමාලෝචනය යටතේ ඇති වසර තුළදී ඉහත පශ්චාත් උපාධි වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

වෛද්‍ය එස්.වී. කමල්, වෛද්‍ය පී.කේ. පෙරේරා සහ වෛද්‍ය අයි.ජී.පී.ආර්. කුලනාථ මෙම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ වෛද්‍යපති උපාධිය සඳහා වූ පශ්චාත්-උපාධි පාඨමාලා (Ayu) 2012/2015 වැඩසටහනේ සම්බන්ධීකාරකවරුන් ලෙස පත් කරන ලදී. ඉන් අනතුරුව වෛද්‍ය ආර්. ඩී. එච්. කුලතුංග සම්බන්ධීකාරකවරයා ලෙස සේවය කළේය.

MD(Ayu) ශිෂ්‍යයින් 19 දෙනෙක් 2014 පෙබරවාරි සිට මැයි දක්වා ඉන්දියාවේ බරණැස හින්දු විශ්වවිද්‍යාලයේ කෙටි කාලීන සායනික පුහුණුව සඳහා විදේශගත විය.

### 3.5 ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර පහත පරිදි වේ

| අංශය | මාධ්‍යය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) |
|---|---|---|---|---|---|
| ආයුර්වේද | සිංහල/ඉංග්‍රීසි | 03 | 27 | 06 | 08 |
| යුනානි | දෙමළ/ඉංග්‍රීසි | - | 18 | 02 | 03 |
| එකතුව | | 03 | 45 | 08 | 11 |

**අධ්‍යයන කාර්ය මණ්ඩලය (ආයුර්වේද සහ යුනානි)**




### 3.6 පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර - 2014

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 01 |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 01 |
| සහකාර මූල්‍යාධිකාරි | 01 |
| සහකාර ලේඛකාධිකාරි | 02 |
| එකතුව | 06 |

නියෝජ්‍ය ලේඛකාධිකාරි විභාග අංශය සහ ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි අධ්‍යයන සහ අනධ්‍යයන ආයතන අංශය භාරව කටයුතු කරයි. එසේම සහකාර ලේඛකාධිකාරි/පාලන සාමාන්‍ය පාලන අංශයද සහකාර ලේඛකාධිකාරි/මූලධන සහ ශිෂ්‍ය සේවා, මූලධන සහ ශිෂ්‍ය සේවා කටයුතු භාරව කටයුතු කරයි. නියෝජ්‍ය මූල්‍යාධිකාරි සැපයීම් සහ ආයතනයේ මූල්‍ය පාලනයද සහකාර මූල්‍යාධිකාරි විසින් වැටුප් සහ ගෙවීම් පිළිබඳවද කටයුතු කරයි.

එසේම පුස්තකාලයේ පරිපාලනය සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති සහ සහකාර පුස්තකාලයාධිපති වශයෙන් පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකු කටයුතු කරන අතර ඔවුන් යටතේ පුස්තකාලය සහ එහි අංශ පාලනය වේ.

### 3.7 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර - 2014

| ශාඛාව/අංශය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ට කාර්ය මණ්ඩලය | සුළු සේවක කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| අධ්‍යක්ෂ කාර්යාලය | -- | 02 | 01 |
| පාලන අංශය | 01 | 08 | 16 |
| ආයතන අංශය | 01 | 02 | 01 |
| විභාග අංශය | 01 | 04 | 02 |
| මූලධන වැඩ සහ ශිෂ්‍ය සුභසාධන අංශය | 01 | 01 | -- |
| ගිණුම් අංශය | 02 | 07 | 01 |
| ආයුර්වේද අංශය | 01 | 08 | 12 |
| යුනානි අංශය | -- | 02 | 02 |
| පශ්චාත් උපාධි අංශය | 01 | 01 | 01 |
| පුස්තකාලය | 01 | 05 | 05 |
| IT අංශය | 01 | -- | 03 |
| එකතුව | **10** | **40** | **44** |

මුළු සාමාජික සංඛ්‍යාව 94ක් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, කළමනාකාර සහකාර, තාක්ෂණික සහ තාක්ෂණික නොවන, පුහුණු, අර්ධ පුහුණු සහ නුපුහුණු කාර්ය මණ්ඩලය ලෙස පරිපාලන අංශ, අධ්‍යයනාංශ, නඩත්තු සහ උද්‍යාන අංශ යටතේ සේවය කරයි. ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ.

## 3.8 කාර්ය මණ්ඩලය සඳහා කුසලතා සංවර්ධන පුහුණුව - 2014

| | පුහුණු වැඩසටහන් ගණන | සහභාගි වූවන් සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 12 | 29 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 01 | 01 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 15 | 33 |

## 3.9 2014 වැඩමුළු සහ සම්මන්ත්‍රණ

2014 ජූලි 24වන දින පර්යේෂණ ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මහාචාර්ය එන්. ගුණවර්ධන සහ ආචාර්ය සී. අරඹෙපොළ විසින් පවත්වනු ලැබූ එය ආචාර්ය පී.කේ. පෙරේරා විසින් සම්බන්ධීකරණය කරන ලදී.

## 3.10 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

ජාතික සහ අන්තර්ජාතික පර්යේෂණ සහ ප්‍රකාශන පිළිවෙළින් 64ක් සහ 144ක් විය.

### 3.11 ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වලදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය

1. 2014 කුලියාපිටිය වයඹ විශ්වවිද්‍යාලයේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය සහභාගී වූ අතර එහි දී ආයුර්වේද වෛද්‍ය ප්‍රදර්ශනයක් සහ ප්‍රදර්ශනයට පැමිණි මහජනතාව වෙනුවෙන් ආයුර්වේද ජංගම සායනයක් පවත්වන ලදී.

2. 2014 ජුනි මස 12වන දින පොසොන් උත්සවය නිමිත්තෙන් අනුරාධපුර පූජා භූමියේදී ආයුර්වේද ජංගම සායනයක් සාර්ථකව පවත්වන ලදී.

3. පර්යේෂණ බලගැන්වීම සඳහා රුසියානු සහ ජපන් පර්යේෂණ කණ්ඩායම් සමග සාකච්ඡාවක් 2014.09.05 දින පවත්වන ලදී.

4. ශ්‍රී ලංකා සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ 1වන ජාතික පරිසංවාදය 2014 ජුනි 28-29 පවත්වන ලදී.





5. ස්වවෛද්‍ය ක්‍රමය පිළිබඳ 1වන ජාතික පරිසංවාදය 2014 සැප්තැම්බර් 19-20 පවත්වන ලදී.

6. ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ 2වන අන්තර්ජාතික පරිසංවාදය (ICAUST) 2014 දෙසැම්බර් 16-18 පවත්වන ලද අතර ප්‍රධාන කථිකයා වශයෙන් වෛද්‍ය විද්‍යා ආයතනයේ, ආයුර්වේද පීඨයේ පීඨාධිපති සහභාගී විය.







7. 2014 ජුලි 21වන දින බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලට රුපියල් මිලියන 1.6ක් වටිනා වෛද්‍ය උපකරණ ප්‍රදානය කරන ලදී.

 

8. නුවර කැන්ඩි සිටි සෙන්ටර්හිදී 2014 ජූලි 25-26 අන්තර්ජාතික ආයුර්වේද අධ්‍යාපනික ප්‍රදර්ශනය පවත්වන ලදී.

9. 2014 පෙබරවාරි - ඉන්දියාවේ බරණැස හින්දු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා ආයතනයේ ආයුර්වේද පීඨය සමග අවබෝධතා ගිවිසුම



10. ජපානයේ, ඔසාකා, කිටා-කු, මිනමිමෝරි-මචි, ශාන්තිලංකා ආයුර්වේද (පුද්ගලික) ආයතනය සමග අවබෝධතා ගිවිසුම - 2014 ජූලි මස සනාතන සභාවට ඉදිරිපත් කරන ලද අතර 2014 ඔක්තෝබර් මස 27වන දින අත්සන් තබන ලදී.



**3:12 ක්‍රියාකාරකම්**

1. තොරතුරු තාක්ෂණ හා භාෂා විද්‍යාගාරය HETC ව්‍යාපෘතිය යටතේ 2014 මාර්තු මස 28වැනි දින පිහිටුවන ලදී. (රුපියල් මිලියන 6ක් උපයෝජනය කරන ලදී.)
2. ආයුර්වේද ඖෂධ ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය 2014 අගෝස්තු මස 07වැනි දින දේශීය වෛද්‍ය ආයතනයේ දී පවත්වන ලදී.
3. ශිෂ්‍යයින් සඳහා වූ නිපුණතා පුහුණු වැඩසටහන 2014 සැප්තැම්බර් මස 02 – 04 දක්වා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී.
4. ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කළ පිරිත් සංජ්ඣායනය 2014 ජනවාරි මස 10-11 දිනවල පවත්වන ලදී.
5. ජෛව-රසායනික විශ්ලේෂණ ඒකකය 2014 ඔක්තෝබර් මස 17වැනි දින පිහිටුවන ලදී.
6. 2014 සැප්තැම්බර් මස 18වැනි දින මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාර පරිශ්‍රයේ ඉදිකිරීම් සඳහා වූ මුල් ගල තබන ලදී.
7. 2014 සැප්තැම්බර් මස 20වැනි දින සහ 2014 දෙසැම්බර් මස 17වැනි දින පරිසර හිතකාමී විවෘත ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් මධ්‍යස්ථාන (2M) දෙක පිහිටුවන ලදී.
8. ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික නිපුණතා වැඩිදියුණු කිරීම වෙනුවෙන් ආදර්ශ, අනුකාරක, වෛද්‍ය උපකරණ සහ යන්ත්‍ර මිල දී ගන්නා ලදී. (රුපියල් මිලියන 18) – 2013 දෙසැම්බර්- 2014 දෙසැම්බර්.
9. අතින් ලියන ලද අත්පිටපත් සංරක්ෂණය සඳහා වූ ව්‍යාපෘතිය 2014 ජනවාරි - දෙසැම්බර් දක්වා අවසාන කරන ලදී. (රුපියල් මිලියන 2) 2014 ජනවාරි - දෙසැම්බර්.

## 4 ශිෂ්‍ය සුභසාධනය

### 4.1 මූල්‍ය සහාය

ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව ලෙස ශිෂ්‍යයන්ට මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

<u>මහපොළ ශිෂ්‍යත්වය</u>

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ දායකත්වය මත කුසලතා හෝ සාමාන්‍ය වශයෙන් ශිෂ්‍යයෙකුට මසකට රු.2550/- හෝ රු.2500/- මුදලක් පිරිනමනු ලැබේ.

| වසර | මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව |
|---|---|
| 1වන වසර | - |
| 2වන වසර | 83 |
| 3වන වසර | 74 |
| 4වන වසර | 38 |
| අවසන් වසර | 38 |
| එකතුව | **233** |

**(2) ශිෂ්‍යාධාර**

පූර්ණ ශිෂ්‍යාධාර සහ අර්ධ ශිෂ්‍යාධාර ලෙස ශිෂ්‍යයෙකුට රු. 2000/- හෝ රු. 1900/- මුදලක් ගෙවනු ලැබේ.

| වසර | ශිෂ්‍යාධාර |
|---|---|
| පළමුවන වසර | - |
| දෙවන වසර | 78 |
| තෙවන වසර | 45 |
| හතරවන වසර | 86 |
| අවසන් වසර | 67 |
| | ------ |
| එකතුව | 276 |
| | ==== |

## 4.2 ශිෂ්‍ය නේවාසිකාගාර

රාජගිරියේ සහ මොරගස්මුල්ලේ පිහිටි ස්වකීය නේවාසිකාගාර දෙකක් සහ කුලියට ගත් නිවාස දෙකක් ආයතනයේ සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමට පවත්වාගෙන යනු ලැබේ.

**කාන්තා නේවාසිකාගාර**

| | මොරගස්මුල්ල නේවාසිකාගාරය | අංක: 12 නේවාසිකාගාරය | විජේරාම නේවාසිකාගාරය |
|---|---|---|---|
| පළමු වසර සිසුන් | 96 | -- | 09 |
| අවසන් වසර සිසුන් | 62 | 34 | -- |
| එකතුව | 158 | 34 | 09 |
| පුරප්පාඩු | 52 | 04 | 21 |

**පිරිමි නේවාසිකාගාර**

| | අංක: 330 නේවාසිකාගාරය | | බොරැල්ල නේවාසිකාගාරය | |
|---|---|---|---|---|
| | ආයුර්වේද | යුනානි | ආයුර්වේද | යුනානි |
| පළමුවන වසර (නව) | - | 13 | 21 | 02 |
| පළමුවන වසර | - | - | 17 | - |
| දෙවන වසර | 08 | 03 | - | - |
| තෙවන වසර | 21 | 02 | - | - |
| හතරවන වසර | 20 | 09 | - | - |
| අවසන් වසර | 09 | 02 | - | - |
| එකතුව | 58 | 29 | 38 | 02 |

## 4.3 ආයතනයේ ශිෂ්‍ය සංගම්

මෙම ආයතනයේ ශිෂ්‍ය සංගමය දේශීය වෛද්‍ය ශිෂ්‍ය කමිටුව ලෙස ක්‍රියාත්මක වේ. එය සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු නිලධාරි මණ්ඩලයකින් සමන්විත වේ. මෙම ශිෂ්‍ය කමිටුව යටතේ ප්‍රධාන අනු කමිටු තුනක් **(03)** ක්‍රියාත්මක වේ.

**(i) කලා අනුකමිටුව**

කලා හා සංස්කෘතික කටයුතු, කලා උළෙල සංවිධානය කිරීම සහ සිසුන්ගේ කලා කටයුතු වර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.

**(ii) ආයුර්වේද ව්‍යාප්ති අනුකමිටුව**

මේ යටතේ පාසල්වල ආයුර්වේදය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම, ජංගම සායන සහ ප්‍රජා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම, කුකුස නමින් සංවාද වැඩසටහනක් පැවැත්වීම මෙමගින් සිදු කෙරේ.

**(iii) ක්‍රීඩා අනුකමිටුව**

වාර්ෂික ක්‍රීඩා උත්සවය සහ අවුරුදු උත්සවය සංවිධානය කිරීම, නවක සිසුන්ගේ ක්‍රීඩා උළෙල පැවැත්වීම, විවිධ ක්‍රීඩා සඳහා සිසුන් යොමු කිරීම හා කාය වර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම මෙමගින් සිදු කෙරේ.

## 4.4 ආයුර්වේද ශික්ෂණ රෝහල

ආයුර්වේද ශික්ෂණ රෝහල දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය උපාධි අපේක්ෂකයන්ට සායනික පුහුණුව ලබා දීම සහ රෝගී ප්‍රතිකාර සේවය සඳහා වෙන් වී ඇත. රෝහල් අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙය ආයතනයට මීටර් **100**ක් පමණ දුරින් කෝට්ටේ පාරේ පිහිටා ඇත.

මෙම සායනික කටයුතු සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ කාර්ය මණ්ඩලයද සහභාගි වන අතර ඒ අනුව සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමට මෙන්ම ආයුර්වේද ශික්ෂණ රෝහලට පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමටද ඔවුන්ගේ දායකත්වය නොමදව ලැබේ.

## 5 යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

### පුනරුත්ථාපන සහ ඉදි කිරීම් -2014

| කොන්ත්‍රාත්තු නම, අංකය | කොන්ත්‍රාත්තු මුදල - රු | ප්‍රගතිය |
|---|---|---|
| ඖෂධාගාරයේ, විද්‍යාගාරයේ පවතින පිරියත සඳහා විදුලි ස්ථාපනයේ වැඩි දියුණු කිරීම් -AA1/3/2014/01 | 936,595/=+VAT | නිම කර ඇත |
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයනාංශයේ වැඩි දියුණු කිරීම් -AA1/3/2014/02 | 564,625/= | නිම කර ඇත |
| විවිධ අධ්‍යයනාංශවල වායු සමීකරණ සඳහා විදුලි බල සැපයුම -AA1/3/2014/04 | 147,625/= +VAT | නිම කර ඇත |
| වැසිකිළි කොටස අලුත්වැඩියාව -AA1/3/2014/05 | 2,452,250/= | නිම කර ඇත |
| ආරක්ෂක කුටියේ වැඩි දියුණු කිරීම් -AA1/3/2014/06 | 895,675/= | නිම කර ඇත |

| | | |
|---|---|---|
| විවිධ අධ්‍යයනාංශ, පරිපාලන සහ පැරණි ගොඩනැගිලි සංකීර්ණය අලුත්වැඩියා කිරීම - AA/1/3/2014/07 | 474,480/= +VAT | නිම කර ඇත |
| ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලේ සිට ක්‍රීඩා පිටිය දක්වා මාර්ග නවීකරණය -AA/1/3/2014/09 | 677,075/= | නිම කර ඇත |
| ව්‍යවච්ඡේද අධ්‍යයනාංශය වැඩි දියුණු කිරීම AA1/3/2014/10 | 1,684,074/= | නිම කර ඇත |
| යුනානි අධ්‍යයනාංශය වැඩි දියුණු කිරීම (නිධාන චිකිත්සා සහ ස්වස්ත වෘත)- AA/1/3/2014/11 | 1,337,410/= | නිම කර ඇත |
| යුනානි දේශන ශාලා අංක -04 වැඩි දියුණු කිරීම -AA1/3/2014/12 | 976,150 + VAT | නිම කර ඇත |
| ද්‍රව්‍යගුණ අධ්‍යයනාංශය සහ ප්‍රධාන කාර්යාලය වැඩි දියුණු කිරීම - AA1/3/2014/13 | 829,450/= VAT | නිම කර ඇත |
| මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාරයේ මායිම් වැට වැඩි දියුණු කිරීම -AA1/3/2014/17 | 752,000/=+VAT | නිම කර ඇත |
| මෞලික සිද්ධාන්ත අධ්‍යයනාංශය වැඩි දියුණු කිරීම -AA1/3/2014/18 | 2,807,950/= | නිම කර ඇත |

## 6 මූල්‍ය සහ ගිණුම්කරණ විස්තර

1. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2011 රු. | 2013 රු. |
|---|---|---|
| 1. පුද්ගල පාරිශ්‍රමිකl | 131,712,424 | 143,904,174 |
| 2. ගමන් වියදම් | 1,722,680 | 242,432 |
| 3. සැපයුම් | 6,081,310 | 6,245,115 |
| 4. නඩත්තුව | 1,477,703 | 2,754,127 |
| 5. කොන්ත්‍රාත්තුමය සේවා | 19,772,382 | 25,774,071 |
| 6. වෙනත් | 2,910,196 | 17,139,295 |
| එකතුව | 163,676,695 | 196,059,214 |

11. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2012 | 2013 |
|---|---|---|
| අ. ලී බඩු සහ කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම | 2,378,090 | 15,962,681 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම් | 2,299,360 | 3,485,495 |
| ඇ. ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කර ගැනීම් | 7,088,214 | 20,455,133 |
| ඈ.වෙනත් (පරිගණක, පොත්පත් සහ වාර සඟරා, ක්‍රීඩා උපකරණ) | 3,017,613 | 2,067,133 |
| එකතුව | 14,783,277 | 41,971,182 |

111. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

| විෂය | 2013 ප්‍රතිපාදන රු. | 2012 වියදම් රු. | ඉතිරිය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 192,189,000 | 196,059,214 | (3,870,214) |
| ආ.ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 44,600,000 | 41,971,182 | 2,628,818 |
| ඇ.ව්‍යාපෘති-දේශීය | - | - | - |
| ඉ.ව්‍යාපෘති-විදේශීය | - | - | - |

IV. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

| ආදායම් මූලාශ්‍රය | 2013 ප්‍රතිපාදන රු. 2013 | 2013 එකතුව රු. | ඌනතාව/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක අධ්‍යයන | - | - | - |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යයන | 4,599,287 | 4,577,809 | 21,478 |
| ඉ. උපදේශන | | | |
| ඊ. වෙනත් ආයුර්වේද ඖෂධ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | | 410,990 | (410,990) |

V. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය – 2013

| විෂය | සූත්‍රය | ශිෂ්‍යයකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ. ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම (RE) | 196,059,241 | 284,556,19 |
| ආ. ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම (CE) | 41,971,182 | 60,916,08 |

❖ පෙර අඩුපාඩු නිවැරදි කිරීම
මින් පෙර රජයේ විගණන අංශය මගින් පෙන්වා දී තිබූ බොහෝ අඩුපාඩු නිවැරදි කර ගැනීමට 2013 වර්ෂයේදී විශේෂ පරිශ්‍රමයක් දරණ ලද බවද මෙහිදී සඳහන් කළ යුතුය.

විශේෂයෙන්ම

- විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම ප්‍රමාද වීම
- අධ්‍යයන අංශවලින් ඉවත්ව යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයක් වීම
- අධ්‍යයන අංශවලින් නිකුත් කරන අවසන් විභාග ප්‍රතිඵල අනුව අසමත් වීමේ ප්‍රතිශතය වැඩි වීම
- මෙම ආයතනයෙන් බිහිවන උපාධිධරයන් සඳහා රැකියා ලැබීමේ සුරක්ෂිතතාව අඩු වීම
- පශ්චාත් උපාධි පාඨමාලා ගණන අඩු වීම

යන සියලු ප්‍රශ්නවලට 2013 වර්ෂයේදී පිළිතුරු ලබා දී ඇත.

1. 2013 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සියල්ලටම පිළිතුරු සපයා ඇත.
2. මෙම ආයතනයේ පාඨමාලා සඳහා තේරී එන සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් අතර මගදී වෙනත් පාඨමාලා සඳහා මෙම ආයතනය හැර යාම 2013 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නැවතී ඇත.

නව පාඨමාලා හඳුන්වා දීම, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වීම, වෘත්තීය මාර්ගෝපදේශක ඒකකයක් ආරම්භ කිරීම, දේශීය වෛද්‍ය ආයතනය කෙරෙහි වඩාත් ආකර්ෂණයක් ඇතිවන පරිදි රැකියා අවස්ථා බිහි කිරීම, රජයේ හා පෞද්ගලික අංශවල ආයතන සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සහ ප්‍රථම වරට මෙරට ආයුර්වේද විශාරද පාඨමාලාවක් ඇති කිරීම මේ සඳහා පිටිවහලක් විය.

යුනානි අවසන් විභාගයෙන් සමත් වීමේ ප්‍රතිශතය 80%ක් ඉක්මවා ගොස් ඇති අතර ලකුණු ලබා දීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් "Grade Point Average" ක්‍රමය යොදා ගැනීම විභාගවල ප්‍රමිතිය තවත් තහවුරු කිරීමට හේතු විය.

# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

## 2014 – 12 – 31 දිනෙන් අවසන් වර්ෂය

## සඳහා මූල්‍ය ප්‍රකාශන

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

INSTITUTE OF INDIGENOUS MEDICINE
UNIVERSITY OF COLOMBO

රාජගිරිය ශ්‍රී ලංකාව
Rajagiriya Sri Lanka

දුරකථන (පොදු) Telephone(General): 2692385 | නියෝජ්‍ය ලේඛකාධිකාරි Deputy Registrar: 2697772
අධ්‍යක්ෂ අධ්‍යක්ෂ: 2861399, 2697175, ෆැක්ස් Fax: 2469710 | නියෝජ්‍ය මූල්‍යාධිකාරි Deputy Bursar: 2689153
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි Senior Assistant Registrar: 2687063 | සහකාර ලේඛකාධිකාරි Assistant Registrar : 2888212

මගේ අංකය: IIM/Fin/2015 ඔබේ අංකය: දිනය:12.06.2015

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

හිතවත් මහත්මයානෙනි,

**2014 වසර සඳහා වූ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (සංශෝධිත) මූල්‍ය ප්‍රකාශන පිළිගැන්වීම**

1985 අංක 07 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (1), (2) සහ 107 (ආ) වගන්ති සහ 1971 අංක 38 දරන මූල්‍ය පනත ප්‍රකාරව 2014 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිගැන්වීමට ලැබීම පිළිබඳව මාගේ ප්‍රීතිය පළ කරමි.
අංක පීඑෆ්/පීඊ/21 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3(අ) වගන්තිය නියම කර ඇති ප්‍රකාරව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(1), (ආ), 2015 මැයි මස 27 දිනැති අංක EC/G/IIM/1/14/FA/01 දරන විගණකාධිපතිගේ ලිපිය සහ 2015 මැයි මස 29 දිනැති අංක IIM/D/172 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂගේ ලිපිය ප්‍රකාරව දක්වා ඇති කාලසීමාව ඇතුළත 2014 වර්ෂය සඳහා වූ (සංශෝධිත) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිගන්වනු ලැබේ.
ස්තුතියි,
මෙයට විශ්වාසී,

ආචාර්ය එස්. ඩී. හපුආරච්චි
අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

පිටපත්
1. ලේකම්, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය
2. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
5. ගණකාධිකාරී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. විගණන අධීක්ෂක, මහජන පුස්තකාලය
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන අංශය (UGC)

## අන්තර්ගතය පිටු අංකය

**I - කොටස**


| | | |
|---|---|---|
| 01. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 23 |
| 02. | මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 24 |
| 03. | ශුද්ධ වත්කම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය | 25 |
| 04. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 26 |
| 05. | ශේෂ පත්‍රය | 27-30 |


**II - කොටස**


| | | |
|---|---|---|
| 06. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන් | 30-38 |
| 07. | මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන් | 39-40 |
| 08. | ශුද්ධ වත්කම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශයට සටහන් | 43 |
| 09. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන් | 44-46 |
| 10. | මූල්‍ය ප්‍රකාශවලට උපලේඛන (A-I) | 46-48 |
| 11. | මූල්‍ය ප්‍රකාශවලට සටහන් | 53-55 |
| 12. | අයවැය වෙන් කිරීම | 56 |
| 13. | විගණකාධිපතිගේ වාර්තාව | 61-71 |
| 14. | විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු | 72-75 |

## 2014 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2014 | 2014 | | 2013 | 2013 |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | | | | |
| මුදල් සහ මුදල් හා සමාන දේ | **1** | 3,976,422 | | | 6,877,991 | |
| ලැබිය යුතු දේ | **2** | 26,240,113 | | | 23,955,594 | |
| තොග | | 1,836,487 | | | 2,134,780 | |
| පෙර ගෙවීම් | **3** | 2,302,761 | | | 0 | |
| | | | **34,355,783** | | | **32,968,365** |
| **වත්කම්** | | | | | | |
| **ජංගම-නොවන වත්කම්** | | | | | | |
| ආයෝජන | **4** | 26,478,100 | | | 270,650 | |
| යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ | **5** | 79,553,922 | | | 57,958,344 | |
| ඉඩම් සහ ගොඩනැගිලි | **6** | 1,412,891,567 | | | 1,416,995,551 | |
| පොත්, වාර සඟරා සහ ක්‍රීඩා උපකරණ | **7** | 4,931,401 | | | 3,101,434 | |
| නොනිමි වැඩ | **8** | 11,178,370 | | | 9,491,293 | |
| | | | **111,535,033,360** | | | **1,487,817,272** |
| **මුළු වත්කම්** | | | **111,569,389,143** | | | **111,520,785,637** |
| **වගකීම්** | | | | | | |
| **ජංගම වගකීම්** | | | | | | |
| ගෙවිය යුතු | **9** | 7,452,347 | | | 11,019,733 | |
| විලම්බිත ආදායම | **10** | 110,598 | | | 80,598 | |
| උපචිත වියදම් | **11** | 12,747,629 | | | 5,300,153 | |
| උපචිත වියදම් - ප්‍රාග්ධන | **12** | 5,861,203 | | | 839,252 | |
| | | | **26,171,777** | | | **17,239,736** |
| **ජංගම-නොවන වගකීම්** | | | | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 48,948,840 | | | 44,557,108 | |
| | | | **48,948,840** | | | **44,557,108** |
| **මුළු වගකීම්** | | | **75,120,617** | | | **61,796,844** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **111,494,268,526** | | | **111,458,988,793** |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන- වැය කළ | **13** | 281,029,509 | | | 243,793,359 | |
| ප්‍රාග්ධන ප්‍රදාන- වැයනොකළ | | 796,091 | | | 203,374 | |
| පොදු සංචිතය | **14** | -108,771,168 | | | -125,106,376 | |
| සමුච්චිත අරමුදල | **15** | 1,321,214,094 | | | 1,340,098,436 | |
| | | | **111,494,268,526** | | | **111,458,988,793** |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | | **111,494,268,526** | | | **111,458,988,793** |

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ කළමනාකාර මණ්ඩලය වෙනුවෙන් සහතික කර නිවැරදි කරන ලදී

| | | | |
|---|---|---|---|
| ආචාර්ය එස්.ඩී. හපුආරච්චි | ආචාර්ය ඒ.එච්.එම්. මව්ජූඩ් | ටී.පී. ලියනාරච්චි | අයි.කේකේ. විජේකෝන් |
| අධ්‍යක්ෂ | නිල බලයෙන් සාමාජික | නියෝජ්‍ය මූල්‍යාධිකාරි | වැඩ බලන නියෝජ්‍ය ලේඛකාධිකාරි |

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය-කොළඹ විශ්වවිද්‍යාලය
2014 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ආදායම</u> | | රු. | රු. |
| පුනරාවර්තන ප්‍රදාන | | 218,760,000 | 192,189,000 |
| පුනරුත්ථාපන වැඩි දියුණු කිරීම් සඳහා රජයේ ප්‍රදාන | | 0 | 312,100 |
| ප්‍රාග්ධන වියදම් - පුනරාවර්තන ස්වභාවයේ | | 1,252,746 | 0 |
| රජය: ප්‍රදාන- මහපොළ භාරකාර අරමුදල | | 4,297,850 | 3,545,350 |
| රජය : ප්‍රදාන- මහපොළ- UGC | | 699,650 | 577,150 |
| රජය : ප්‍රදාන- ශිෂ්‍යාධාර- UGC | | 4,545,000 | 5,075,000 |
| වෙනත් ආදායම් | 16 | 11,254,089 | 7,236,569 |
| සම්මන්ත්‍රණ ආදායම | 17 | 6,096,765 | 0 |
| ක්‍රමක්ෂය | | 39,896,947 | 28,334,332 |
| | | 286,803,047 | 237,269,501 |
| <u>මෙහෙයුම් වියදම්</u> | | | |
| සාමාන්‍ය පරිපාලනය | 18 | 83,873,531 | 66,197,153 |
| අධ්‍යයන සේවා | 19 | 136,126,702 | 118,352,592 |
| පුස්තකාල සේවා | 20 | 11,712,734 | 9,532,197 |
| නේවාසිකාගාර | 21 | 3,263,453 | 1,265,172 |
| පශ්චාත් උපාධි වියදම් | | 0 | 31,143 |
| සම්මන්ත්‍රණ වියදම් | 22 | 6,108,279 | 0 |
| භෛෂජ්ජ වියදම්-14/16 | | 398,708 | 0 |
| පශ්චාත් උපාධි වියදම්-ආයුර්වේද | | 2,420,000 | 893,333 |
| පශ්චාත් උපාධි වියදම්-යුනානි | | 880,000 | 320,000 |
| භෛෂජ්ජ වියදම්12/14 | | 0 | 410,990 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | | 39,896,947 | 30,895,709 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් වැඩි කිරීම | | 6,477,885 | 5,423,983 |
| විගණන ගාස්තු | | 400,000 | 400,000 |
| M.D. වියදම් | | 3,333,334 | 3,333,333 |
| පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීමේ වියදම් | | 0 | 312,100 |
| ප්‍රාග්ධන වියදම් - පුනරාවර්තන ස්වභාවයේ | | 1,337,056 | 0 |
| මුළු මෙහෙයුම් වියදම් | | 296,228,629 | 237,367,705 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (ඌනතාව) | | -9,425,582 | -98,204 |
| විකුණුම්/ඉඩම් විකිණීම | | 25,200,000 | 0 |
| ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (ඌනතාව) | | 15,774,418 | -98,204 |

නියෝජ්‍ය මූල්‍යාධිකාරි
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

**2014 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ශුද්ධ වත්කම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | පොදු සංචිතය රු. | ප්‍රාග්ධන ප්‍රදාන වැය කළ රු. | ප්‍රාග්ධන වැයනොකළ රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | සමුච්චිත අරමුදල රු. | මුළු රු. |
|---|---|---|---|---|---|---|---|
| **2012 දෙසැම්බර් 31 දිනට** | | - | | | | | **1** |
| **ශේෂය** | | 127,114,484 | 212,202,924 | 1,516,797 | 1,330,888,895 | 23,505,319 | **1,440,999,451** |
| | | | - | | | | - |
| ක්‍රමක්ෂය | | | 14,010,888 | | -14,323,444 | | 28,334,332 |
| වත්කම් අත්පත් කර ගැනීම් | | | 45,913,423 | | | | 45,913,423 |
| ලැබීම් | | | | 44,600,000 | | 27,666 | 44,627,666 |
| | | | | - | | | - |
| වියදම් | | | | 45,913,423 | | | 45,913,423 |
| මූල්‍ය කාර්ය සාධනය සඳහා ප්‍රකාශය | | 2,106,312 | | | | | 2,106,312 |
| ක්‍රමක්ෂය වියදම් | | | | | | | - |
| කාල පරිච්ඡේදය සඳහා | | -98,204 | | | | | - |
| අතිරික්තය / (ඌනතාව) | | | | | | | 98,204 |
| පුනරුත්ථාපන වියදම් | | | -312,100 | | | | 312,100 |
| **2013 දෙසැම්බර් 31වන** | | **-** | | | | | |
| **දිනට ශේෂය** | | **125,106,376** | **243,793,359** | **203,374** | **1,316,565,451** | **23,532,985** | **1,458,988,793** |
| ප්‍රත්‍යාගණන ලාභ අතිරික්තය | | | | | -6,300,000 | | -6,300,000 |
| | | | - | | | | |
| ක්‍රමක්ෂය | | | 25,765,669 | | -14,131,278 | | -39,896,947 |
| වත්කම් අත්පත් කර ගැනීම් | | | 68,095,313 | | | | 68,095,313 |
| මෝටර් රථය - ප්‍රත්‍යාගණන | | | | | -395,833 | | -395,833 |
| මාරු කිරීම | | | -500,000 | | | | -500,000 |
| නේවාසිකාගාර පාලක නවාතැන්- ප්‍රත්‍යාගණනය | | | | | -1,715,000 | | -1,715,000 |
| ලැබීම් | | | | 68,150,000 | | 3,657,769 | 71,807,769 |
| | | | | - | | | |
| වියදම් | | | | 67,558,152 | | | -67,558,152 |
| පෙර වර්ෂයේ ගැළපුම් | | | -869 | 869 | | | |
| මූල්‍ය කාර්ය සාධනය සඳහා ප්‍රකාශයෙහි හඳුනා නොගත් ශුද්ධ ලැබීම් සහ හානි | **23** | 560,790 | | | | | 560,790 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාව) | | 15,774,418 | | | | | 15,774,418 |
| පර්යේෂණ බලගැන්වීම | | | -4,592,625 | | | | -4,592,625 |
| **2014 දෙසැම්බර් 31වන** | | - | | | | | |
| **දිනට ශේෂය** | | 108,771,168 | 281,029,509 | 796,091 | 1,294,023,340 | **27,190,754** | **1,494,268,526** |

නියෝජ්‍ය මූල්‍යාධිකාරී
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

## දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය-කොළඹ විශ්වවිද්‍යාලය
## 2014 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය</u> | | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (ඌනතාව) | | 15,774,418 | | -98,204 | |
| ඉඩම් විකුණුම් | | -25,200,000 | | | |
| ඉතුරුම් ගිණුමෙන් පොළිය | | -22,994 | | | |
| මෙහෙයුම් අතිරික්තය/(ඌනතාව) | | -9,448,576 | | | |
| <u>මුදල් නොවන සංසරණ</u> | | | | | |
| වෙනත් ගැළපුම් | **24** | -9,204,612 | | -337,994 | |
| ක්ෂය | | 39,896,947 | | 30,895,709 | |
| | එස්.එම්. රාසූඩීන් | |
| | | 115 |
| 14932 | එල්.යූ. මුනාලිබ් | |
| | | 1,168 |
| | ඩී.ඒ.ආර්. සකුන්තලා | |
| 14933 | | 2,449 |
| | එච්.ඒ.එස්. ආරියවංශ | |
| | | 1,830 |

| | | |
|---|---|---|
| | එන්.ඩී. කොඩිතුවක්කු | 2,730 |
| | ඒ.ඩබ්ලිව්.එස්. ෆවුමියා | 400 |
| 16789 | එල්.ඒ.පී. කරුණාතිලක | 1,300 |
| 16858 | එම්.ඩබ්ලිව්.එස්.එස් කුලතුංග | 1,334 |
| | ඊ.ආර්.එච්.එස්.එස්. එදිරිවීර | 992 |
| | ටී.ඩී.එන්. කරුණාරත්න | 1,119 |
| | කේ.අයි.ඩබ්ලිව්.කේ. සෝමරත්න | 348 |
| | ඩබ්ලිව්.කේ.ආර්.ඩී.එස්. ප්‍රනාන්දු | 108 |
| | ඩබ්ලිව්.එස්. ෆවුසියා | 216 |
| | ෆවුමියා | 292 |
| | එම්.එච්.එම්. හාෆ් | 434 |
| | මුනාලිබ් | 120 |
| 16864 | ඒ.ජී. සමරවික්‍රම | 334 |
| | ෆවුසියා | 80 |
| 16865 | එස්.ඩී. හපුආරච්චි | 1,268 |
| | පී.ආර්. කරුණාරත්න | 185 |
| | ඒ.එම්. මුනාලිබ් | 320 |
| 17058 | මුනාලිබ් | 522 |
| | පී.ආර්. වරාතැන්න | 832 |
| | එම්. විමලසිරි | 195 |
| | එම්.අයි. මනූහා | 464 |
| | එස්.එස්. ෆවුමියා | 80 |
| | ෆස්ලුල් හග් | 240 |
| | රිස්නියා | 272 |
| | ඒ.එම්. මුනාලිබ් | 827 |
| | එම්.එල්.යූ. සල්මා | 500 |
| 19050 | 19050 | 320 |
| 19051 | 19051 | 3,565 |
| 19733 | එම්.අයි. මනූහා | 3,450 |
| | අයි.එල්. ෆර්සනා | 1,500 |
| | එම්.එෆ්. ඉසඩ්. ෆර්සනා | 1,500 |
| 19734 | එදිරිවීර | 2,600 |
| | ඒ.ජී. සමරවික්‍රම | 1,400 |
| | එම්.එෆ්. ජේ. ෆර්සනා | 2,200 |
| | බී.යූ. නජීබ් | 1,000 |
| | එච්.එම්.පී. ප්‍රනාන්දු | 250 |
| 21228 | R21228 | 16,159 |
| 21785 | R21785 | 2,600 |

| | | | | |
|---|---|---|---|---|
| | | 23088 | R23088 | 1,000 |
| | | 23089 | R23089 | 1,040 |
| | | 23099 | R23099 | 1,509 |
| | 2014 | 24924 | ආචාර්ය එම්.එස්.එස්. පර්සියා | 3,276 |
| | | 24925 | ආචාර්ය එම්.එස්.එස්. පර්සියා | 8,492 |
| | | 24925 | බී.එම්.එස්. අමරජීව | 11,916 |
| | | 25102 | බී.එම්.එස්. අමරජීව | 1,200 |
| | | 25111 | බී.එම්.එස්. අමරජීව | 1,200 |
| | | 25589 | ආචාර්ය එම්.එස්.එස්. පර්සියා | 833 |
| | | 26868 | ආචාර්ය ඉසඩ්.එෆ්.එම්. කවුෂික් | 2,242 |
| | | 27313 | ආචාර්ය එල්.පී.ඒ. කරුණාතිලක | 1,000 |
| | | 29253 | ආචාර්ය එස්.වී. කමල් | 420 |
| | | 29253 | ආචාර්ය එල්.පී.ඒ. කරුණාතිලක | 6,200 |
| | | 29253 | ආචාර්ය සමරවික්‍රම | 2,610 |
| | | 29254 | ආචාර්ය එන්.එන්.එන්. සුබයිර් | 12,074 |
| | | 29254 | ආචාර්ය. ඒ.එල්.යූ. ඉෂාන් | 3,430 |
| | | 29278 | Ayu කථිකාචාර්ය | 15,200 |
| **85,171** | | | | 155,265 |

**උපලේඛනය D**

<u>**අවලංගු වූ චෙක්පත්**</u>

| 2013 | | | | 2014 |
|---|---|---|---|---|
| | **දිනය** | **විස්තරය** | **යොමු..** | **ගණන** | |
| | 2011.03.3 | **R11429** | 296202 | දීප්ති මෙනෙවිය | 1,500 |
| | | | 296203 | එස්. විමලසේන | 1,700 |
| | | | 296206 | සුරේන්ද්‍ර පෙරේරා | 700 |
| | | | 296207 | කුෂාන් තෙන්නකෝන් | 1,200 |
| | | | 296208 | එල්.ජී. ධර්මසිරි | 500 |
| | | **R11430** | 296209 | කේ.ඩී. ලොකුගමගේ | 1,000 |
| | | | 296210 | සුධර්මා කොඩිතුවක්කු | 500 |
| | | | 296212 | ඩබ්ලිව්.ඩී. රත්නසූරිය | 500 |
| | | | 296213 | එම්.අයි. තාබෘ | 1,500 |
| | 2011.03.23 | **R11583** | 300142 | ප්‍රිමියම් අන්තර්ජාලය | 52,650 |
| | | | 300261 | එස්.අයි. පලිහවඩන | 66 |
| | | | 300267 | එච්.එච්.ඒ.පී. සේනානායක | 203 |
| | | | 300270 | එස්.ඒ.ඒ.ඩී. දේවානන්ද | 154 |

| | | | | |
|---|---|---|---|---|
| 2011.05.31 | **R12166** | 302533 | එච්.ඒ.පී. සේනානායක | 1,264 |
| | | 302535 | ඒ. වික්‍රමවංශ | 257 |
| | | 302536 | ඩබ්ලිව්.එච්.ඒ.පී. සේනානායක | 257 |
| | | 302686 | ටී.ඊ. ඉන්ද්‍රරත්න | 2,500 |
| | | 302761 | එල්.ආර්.ඩබ්ලිව්. පද්මසීලි | 638 |
| | | 302764 | ආර්.කේ.ඩී.පී.එම්. රණසිංහ | 264 |
| | | 302769 | එම්.ඩී.සී. ජයමාන්න | 6,000 |
| | | 302868 | සී/ස ජිනසේන | 5,359 |
| | | 302881 | ජේ. වික්‍රමසිංහ | 512 |
| 2011.09.08 | R13391 | 302892 | දේශීය ආදායම් | 2,355 |
| | R13392 | 302912 | දේශීය ආදායම් | 325 |
| 2011.10.13 | R13775 | 210607 | එම්.අයි. මනුහා | 408 |
| | | 210778 | දේශීය ආදායම් | 1,617 |
| | | 210915 | මහජන බැංකුව, ගංගොඩවිල | 300 |
| | | 228834 | දේශීය ආදායම් | 15,218 |
| 2011.12.27 | R14612 | 229199 | නිදහස් සේවක සංගමය | 5,000 |
| | | 229290 | එස්. ගුණවර්ධන | 2,680 |
| | | 247280 | එල්.එල්. පද්මශාන්ති | 2,000 |
| | | 247380 | එම්.වී.ඩී. ශාන්ත | 500 |
| 2012.06.29 | | 248084 | | 700 |
| 2012.09.21 | R17010 | 281657 | මහජන බැංකුව, ගංගොඩවිල | 225 |
| 2012.09.21 | R17010 | 281828 | මහජන බැංකුව, ගංගොඩවිල | 225 |
| 2012.09.21 | R17010 | 281002 | මහජන බැංකුව, ගංගොඩවිල | 225 |
| 2012.09.21 | R17010 | 282128 | එස්.ගුණවර්ධන | 3,066 |
| 2012.09.21 | R17010 | 282221 | මහජන බැංකුව, යූනියන් පෙදෙස | 225 |
| 2012.09.21 | R17010 | 281417 | ජ්‍යෝ. කාර්ය මණ්ඩලය | 50 |
| 2012.09.21 | R17010 | 362420 | මහජන බැංකුව, ගංගොඩවිල | 200 |
| 2012.06.28 | R18802 | 362925 | පී.ආර්. කුලනාථ | 22,000 |
| 2012.07.06 | R18802 | 362976 | උඩවෙල රේවත | 25,440 |
| 2012.07.06 | R18802 | 362977 | ඩී.ඩබ්ලිව්. වීරසූරිය | 618 |
| 2012.07.06 | R18802 | 362978 | යූ. ජෝතිපාල | 170 |
| 2012.07.06 | R18802 | 362982 | ඩබ්ලිව්.එම්.ඒ.එස්.බී. විජේසූරිය | 246 |
| 2012.07.06 | R18802 | 362983 | ටී.එම්.අයි.කේ. තෙන්නකෝන් | 260 |

| | | | | |
|---|---|---|---|---|
| 2012.07.06 | R18802 | 362984 | ඩී.ඩබ්. වීරසූරිය | 474 |
| 2012.07.25 | R18802 | 363122 | ඩී.ඩබ්. වීරසූරිය | 939 |
| 2012.08.22 | R18802 | 363230 | සෙලින්කෝ-කේ.සී. පෙරේරා | 1,251 |
| 2012.08.22 | R18802 | 363231 | සීටීසී ඊගල් | 722 |
| 2012.09.26 | R18802 | 363394 | එල්.ඒ.ඩබ්. පද්මසිරිi | 843 |
| 2012.09.26 | R18802 | 363395 | ඒ.එම්. ඉන්ද්‍රලතා | 440 |
| 2012.09.26 | R18802 | 363397 | ඩී.ඩබ්. වීරසූරිය | 2,385 |
| 2013.06.10 | R21072 | 409544 | නිට්ටඹුව බැංකුව | 1,000 |
| 2013.06.10 | R21072 | 409594 | | 300 |
| 2013.06.10 | R21072 | 409595 | දේශීය ආදායම් | 800 |
| 2013.06.10 | R21072 | 409760 | | 1,826 |
| 2013.06.10 | R21072 | 409835 | කේ.සී. පෙරේරා | 1,251 |
| 2013.06.10 | R21072 | 409882 | | 1,000 |
| 2013.06.10 | R21072 | 409919 | | 2,544 |
| 2014.01.01 | R24500 | | | 67,210 |
| 2014.02.17 | R25313 | | සීටීසී ඊගල් | 297 |
| 2014.08.25 | R27020 | 407274 | | 2,228 |
| 2014.08.22 | R27019 | 454763 | ඩිලානි ලොකුහෙට්ටි | 500 |
| 2014.08.22 | R27019 | 454764 | සෙනරත් තෙන්නකෝන් | 500 |
| 2014.08.25 | R27019 | 454717 | අයිරා තාබෘ | 1,000 |
| 2014.08.25 | R27018 | 455171 | | 151,200 |
| 2014.08.25 | R27018 | 455195 | අයිරා තාබෘ | 1,000 |
| 2014.08.25 | R27018 | 455196 | රේණුකා ජයතිස්ස | 1,000 |
| 2014.08.25 | R27018 | 455202 | | 950 |
| 2014.08.25 | R27018 | 455247 | | 100 |
| 2014.08.25 | R27018 | 455336 | | 1,950 |
| 2014.08.25 | R27018 | 455340 | | 1,500 |
| 2014.08.25 | R27018 | 455342 | | 1,550 |
| 2014.08.25 | R27018 | 455343 | | 1,500 |
| 2014.08.25 | R27018 | 455345 | ගිහාන් ඩි චිකරිස් | 1,450 |
| 2014.08.25 | R27018 | 455558 | | 1,764 |
| 2014.08.25 | R27018 | 455610 | ඒ.එම්. ඉන්ද්‍රලතා | 1,350 |
| 2014.08.25 | R27018 | 455635 | | 5,000 |
| 2014.08.25 | R27018 | 454670 | ජේ.ඒ.පී. ජයසූරිය | 244 |
| 2014.08.25 | R27018 | 455784 | යුනයිටඩ් ප්‍රින්ටර්ස් | 5,400 |
| 2014.08.25 | R27018 | 488239 | ටාටා ටෙක්ස් | 806 |
| 2014.08.25 | R27018 | 488431 | ඒ. ක්‍රිෂ්ණපිල්ලෙයි | 2,940 |
| 2014.12.22 | R29255 | ,034072 | උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය. | 13,000 |
| **'9,051.00** | | | | **443,489** |

# රඳවා ගැනීම්

උපලේඛනය G

| 2013 | ශීර්ෂ අංකය | | විස්තරය | 2014 මුදල |
|---|---|---|---|---|
| | 2012- | 9 | ලිනස් ඉලෙක්ට්‍රිකල් | 1,712 |
| | | 13 | කේ.ජේ. ඉන්ටීරියර්ස් | 5,780 |
| | | 35 | ඒසීර් ලංකා | 32,654 |
| | | 57 | අශෝක වෙලිඩින් | 22,940 |
| | | 68 | ආසිරි කන්ස්ට්‍රක්ෂන්ස් | 22,935 |
| | | 69 | ඒසීර් ලංකා | 219,795 |
| | | 97 | ක්‍රාෆ්ට් | 12,849 |
| | | 10 | දුලන්ගා ඇසෝසියේට් | 50,370 |
| | | 87 | ලිනස් ඉලෙක්ට්‍රිකල් | 66,902 |
| | | 86 | එම්ජේපී මෙන්ඩිස් | 5,885 |
| | **2013-** | 72 | සුමුදු එන්ටර්ප්‍රයිසස් | 13,440 |
| | | 124 | ඒටීඒ ඉන්ටර්නැෂනල් | 38,397 |
| | | 134 | ඩීබී ගනේගොඩ ඇසෝසියේට් | 62,733 |
| | | 163 | සුමුදු එන්ටර්ප්‍රයිසස් | 25,312 |
| | **2014-** | 12 | අක්බාර් ෆාමසූටිකල්ස් | 23,913 |
| | | 52 | වානක කන්ස්ට්‍රක්ෂන් | 28,231 |
| | | 89 | ජෝන් මිරර් | 5,544 |
| | | 119 | ලිනස් ඉලෙක්ට්‍රිකල් | 7,111 |
| | | 126 | උදාර ලංකා | 46,830 |
| | | 142 | ලිනස් ඉලෙක්ට්‍රිකල් | 23,744 |
| | | 168 | CBA | 126,000 |
| | | 187 | S& B බිල්ඩර්ස් | 122,613 |
| | | 189 | ලිනස් ඉලෙක්ට්‍රිකල් | 37,600 |
| | | 195 | හෙම්සන්ස් ඉන්ටර්නැෂනල් | 67,788 |
| | | 204 | අබාන්ස් (පුද්) සමාගම | 137,900 |
| | | 200 | වීඑස් ඉන්ෆොමේෂන් | 210,688 |
| | | 213 | ලීමා ක්‍රියේෂන් | 15,674 |
| | | 214 | S& R බිල්ඩර්ස් | 44,784 |
| | | | | 387,204 |
| **5,237,560** | | | | **1,867,328** |

## දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය
## අයවැයගත වෙන් කිරීම සහ සත්‍ය වියදම - 2014

| 2013 | ශීර්ෂ අංකය | | අනුමත අයවැය 2014 | සත්‍ය 2014 | අතිරික්තය හෝ ඌනතාව | හේතු |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 (4-5) | 7 |
| 143,904,174 | 1 | පුද්ගල පාරිශ්‍රමික | 172,980,000 | 175,102,128 | -<br>-2,122,128 | කාර්ය මණ්ඩලය මණ්ඩලය සඳහා පාරිතෝෂික ගෙවීම. |
| 242,432 | 2 | ගමනාගමන වියදම් | 280,000 | 171,939 | 108,061 | අඩු විදේශ ගමන්. |
| 6,245,115 | 3 | සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය | 6,145,000 | 7,548,915 | -1,403,915 | අයිතමවල වෙළඳ පොළ අගය ඉහළ යාම. |
| 2,754,127 | 4 | නඩත්තු | 1,820,000 | 1,538,371 | 281,629 | අඩු වාහන සහ ගොඩනැගිලි නඩත්තුව. |
| 25,774,071 | 5 | කොන්ත්‍රාත්තුමය සේවා | 25,790,000 | 31,047,420 | -5,257,420 | ආරක්ෂක, විදුලි සහ ජල බිල්පත් ඉහළ යාම. |
| 7,229,695 | 6 | වෙනත් පුනරාවර්තන වියදම් | 12,510,000 | 10,025,147 | 2,484,853 | වෙනත් පුනරාවර්තන වියදම්වල පාලනය. |
| **186,149,614** | | මුළු පුනරාවර්තන වියදම | **219,525,000** | **225,433,920** | **-5,908,920** | |

+

2014. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන

1. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1. පොදු ප්‍රතිපත්ති

1.1.1 වාර්තාකරණ ආස්ථිතාය

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ අංක 67/14 දරන ආඥා පනත යටතේ 1980.01.01 දින සංස්ථාපිත ආයතනයකි.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ආයතනයේ වත්කම්, වගකීම්, ශුද්ධ වත්කම්, ආදායම, වියදම් හා සියලුම මෙහෙයුම්වල වෙනත් ගනුදෙනු නිරූපණය වේ.

1985 අංක 07 දරන (සංශෝධිත) විශ්වවිද්‍යාල පනත සහ 1971 අංක 38 දරන මූල්‍ය පනත ඇතුළුව පසුකාලීන පනත්වලින් සංශෝධිත විශ්වවිද්‍යාල පනතේ 106 (1), (2) සහ 107(ආ) වගන්ති ප්‍රකාරව මූල්‍ය පරිපාලනය මඟින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය ආයුර්වේදය, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වල උපදෙස් ලබා දෙන ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනය වේ. ආයුර්වේද විද්‍යාලය දිවයින තුළ මුලින්ම පිහිටුවන ලද ආයතනය වන අතර පසුව 1977 වසරේ දී එම ආයතනය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය ලෙස කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය මූලික සෞඛ්‍ය රැකවරණය, පොදු සෞඛ්‍ය රැකවරණ ගැටලු, සෞඛ්‍ය නඟා සිටුවීම සහ රෝග නිවාරණය යන අභියෝගාත්මක අවශ්‍යතා ඉටු කරනු වස් වෛද්‍ය වෘත්තිකයින් බිහි කරයි.

ආයතනය මූලික වශයෙන් රජයේ අරමුදල්වලින් ක්‍රියාත්මක වේ.

1.1.3 පිළියෙළ කිරීමේ පදනම

(i) අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම්වල සිදු වූ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහය ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ආදිය ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම ප්‍රකාශ පිළියෙළ කර ඇත.

(ii) මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇති අතර ප්‍රකාශ කර ඇති අවස්ථා හැරුණු කොට මූල්‍ය වටිනාකම්වල වෙනස් වීම් සැලකිල්ලට ගෙන නොමැත. පිරිවැය වත්කම් සඳහා හුවමාරුවල දී ඇති සාධාරණ වටිනාකම මත පදනම් වේ.

(iii) කෘත්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලබන අතර එය ආයතනයේ කෘත්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වේ.

1.2 වත්කම් සහ ඒවායේ වටිනාකම සඳහා පදනම්

1.2.1 දේපළ, ගෘහභාණ්ඩ, පිරියත හා උපකරණ

ආයතනයේ කාර්යාලය, විද්‍යාගාරය හා ඉගැන්වීම් උපකරණ, ගොඩනැගිලි, ගෘහභාණ්ඩ සහ සවි කිරීම් හා වාහන ප්‍රත්‍යාගණනය කර, 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගිණුම්වල හඳුනා ගෙන ඇත. ප්‍රත්‍යාගණනය කරන ලද ඉඩම් වටිනාකම 2011.12.31 වැනි දිනට මූල්‍ය ප්‍රකාශයට සැලකිල්ලට ගනු ලැබේ. කාල සීමාව තුළ දී මිල දී ගෙන ඇති දේපළ, පිරියත හා උපකරණ සහ පුස්තකාල පොත් පිරිවැයට දක්වා ඇත.

ක්ෂය වීම් ප්‍රත්‍යාගණනය කළ වටිනාකම මත සහ මිල දී ගැනීමේ පිරිවැය මත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට අය කර ඇත. පහත වාර්ෂික අනුපාත යොදා ගෙන ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහභාණ්ඩ හා සවි කිරීම් | 10% |
| කාර්යාලය විද්‍යාගාරය හා ඉගැන්වීම් උපකරණ | 20% |
| පරිගණක | 20% |
| මෝටර් රථ | 20% |
| පුස්තකාල පොත් | 20% |
| ක්‍රීඩා උපකරණ | 20% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 20% |
| අර්ධ-ස්ථිර දේශන ශාලාව | 20% |
| කොන්ක්‍රීට් බංකු | 20% |

2014 වර්ෂය සඳහා ක්ෂය වීම් වෙනුවෙන් රු. මිලියන 39.8ක මුදලක් ලබා දී ඇත. එය රු. මිලියන 8.9කින් වැඩි වී ඇත.

(රජයේ ප්‍රදානවලින් මිල දී ගත්, 2011.01.01 දිනට ප්‍රත්‍යාගණනය කළ, ත්‍යාග හා පරිත්‍යාග ලෙස ලැබූ) සියලුම ස්ථාවර වත්කම්වල ක්ෂයවීම් ක්‍රමක්ෂය කර ඇත.

තොග වටිනාකම 2013 වසරට වඩා රු. මිලියන 0.3කින් අඩු වී ඇත.

පශ්චාත්-උපාධි ආදායම, ණය හා අත්තිකාරම් ඉහළ යාම හේතුවෙන් ලැබිය යුතු දෑ රු. මිලියන 2.3කින් ඉහළ ගොස් ඇත.

නව නේවාසිකාගාර දෙකේ කුලී ගාස්තු හේතුවෙන් පූර්ව-ගෙවීම් ලෙස රු. මිලියන 2.3ක් දැරීමට සිදු වී ඇත.

නව ස්ථාවර තැන්පතු හේතුවෙන් ආයෝජන රු. මිලියන 26.2කින් වැඩි වී ඇත.

නව මෝටර් රථ, කාර්යාල විද්‍යාගාරය හා ඉගැන්වීම් උපකරණ හා වෙනත් උපකරණ හේතුවෙන් යටිතල පහසුකම්, පිරියත හා උපකරණ වටිනාකම රු. මිලියන 21.6කින් ඉහළ ගොස් ඇත.

ආයතනයේ ඉඩමට අයත් පර්චස් 10.08ක කොටසක් අලෙවි කොට මූල්‍ය වර්ෂය තුළ දී රු. මිලියන 25.2ක මුදලක් ලබා ගෙන ඇත.

1.2.2 තොග

තොග පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

1.2.3 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවා නිෂ්කාශණයට ඇස්තමේන්තු කළ මුදල අනුව දක්වනු ලැබේ.

1.2.4 කෙටි කාලීන ආයෝජනය

ඇතැම් ආයෝජන පොලී සමඟ නැවත අලුත් කර ඇත.

1.3 වගකීම් හා විධිවිධාන

2014.12.31 වන දිනට සියලුම දන්නා වගකීම් මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කර තිබෙන අතර දන්නා නමුත් මුදල නිවැරදිව තීරණය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලස්වා ඇත.

ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් හෝ වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්වය තුළ ජංගම-නොවන වගකීම් ලෙස දක්වා ඇත.

2014.1231වන දිනට ආයතනයට එරෙහිව අධිකරණ නඩු කටයුතු පහක් තිබෙන අතර එම නඩුකර සඳහා වැයවෙන බවට ඇස්තමේන්තු කළ මුදල රු. මිලියන 0.9කි.

1.3.1 ප්‍රදානසඳහා ගිණුම්කරණය

ආයතනය විසින් වියදම් සඳහා දැරූ මුදල් සඳහා වූ වන්දිපූරණය කරන ප්‍රදානවියදම් හඳුනා ගෙන ඇති කාලසීමාව තුළදීම මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනා ගෙන ඇත. වත්කම්වල පිරිවැය සඳහා ආයතනයට වන්දිපූරණය කරන ප්‍රදානඅදාළ වත්කමේ ප්‍රයෝජනවත් කාලසීමාව සඳහා ක්‍රමානුකූල පදනම මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත.

1.3.2 සේවක ප්‍රතිලාභ

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය හා වන්දි ආදී සාධක මත විශ්‍රාම යාමේ දී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය සඳහා ප්‍රතිලාභ සැලසුමක් නිර්ණය කරන ලදී.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූලා තත්ත්වය තුළ හඳුනා ගත් වගකීම 2015.12.31 දිනට ඇති බැඳීමේ වර්තමාන වටිනාකම වේ.

1.4 ආදායම හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා යන පරිදි ආදායම හඳුනා ගැනේ.

2014 වසර සඳහා පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු රජයේ ප්‍රදානය රු. මිලියන 218.76ක් විය.

1.5 වියදම

වියදම් දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව මූලා කාර්යසාධනය තුළ හඳුනා ගනු ලැබේ. ආයතනය පවත්වා ගෙන යාමේ දී සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී දැරූ සියලුම විදයම් වසර සඳහා අතිරික්තය/ හිඟය අනුව ආදායමට එකතු කර ඇත.

1.6 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක සංඛ්‍යා හැකි සෑම අවස්ථාවකදීම සෑම ප්‍රකාශයකම දක්වා ඇත.

ඊසී/ඒ/අයිඅයිඑම්/1/14/එෆ්ඒ/01 2015 ජූලි 17 දින

අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ107(5) උපවගන්තිය, 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2015 මැයි 27 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

62

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනමව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03

'' ත්‍යාග හා ප්‍රදාන'' ලෙස ආයතනයට ලැබී ඇති වත්කම් වලට අදාලව ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් සමාලෝචිත වර්ෂයේදී හඳුන්වා දී තිබු නමුත් , ඉකුත් කාලපරිච්ඡේදයට අදාළ ක්ෂය ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබු බැවින් ගිණුම්වල පෙන්නුම් කරන '' ත්‍යාග හා ප්‍රදාන'' ජංගම නොවන වත්කම් වලින් නියෝජනය නොකෙරුණි.

එසේම ත්‍යාග හා ආධාර වශයෙන් ලැබුණු ස්ථාවර වත්කම්වල සමාලෝචිත වර්ෂයේ රු.3,049,949 ක් වූ ක්‍රමක්ෂය වටිනාකම ත්‍යාග හා ආධාර ගිණුමට හර කරනු වෙනුවට රජයේ ප්‍රාග්ධන ආධාර ගිණුමට හරකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07

(i) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය හේතුවෙන් වැඩිවූ ක්ෂය ප්‍රමාණය සෘජුවම සමුච්චිත අරමුදලට ගැළපිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ රු.14,131,278 ක් වූ ප්‍රත්‍යාගණන අතිරික්තය සඳහා වූ ක්ෂය ආදායම් හා වියදම් ගිණුමට බැර කර තිබුණි.

(ii) 2014 වර්ෂයේදී කඩා ඉවත්කරන ලද මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාර උපපාලිකා නිල නිවාසය 2011 ජනවාරි 01 දින ප්‍රත්‍යාගණනය කර තිබූ නමුත් එවකට වත්කමේ පැවති ශුද්ධ වටිනාකම හඳුනා නොගෙන, ප්‍රත්‍යාගණිත සම්පූර්ණ අගය වූ රු.2,100,000 ක් ප්‍රත්‍යාගණිත අතිරික්තයක් ලෙස සලකා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී එම වත්කම බැහැර කිරීමේදී සත්‍ය වශයෙන් වූ අලාභය නිවැරදිව ගණනය කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම වලදී ප්‍රාග්ධනීත කරන ලද වියදම් ද නිශ්චිතව හඳුනාගෙන නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි 01 දිනට රු.318,070,239 කට ප්‍රත්‍යාගණනය කරන ලද ස්ථාවර වත්කම් වර්ග 06 ක ප්‍රයෝජනවත් ආයු කාලය නිශ්චය කර නොතිබූ බැවින් ස්ථාවර වත්කම් ක්ෂය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වෙන්දේසියක් මගින් ඉවත් කළ ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය, සැළකිල්ලට නොගෙන අලවියෙන් ලද සම්පූර්ණ මුදල වූ රු.158,529 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 21 වන ශත වර්ෂයට උසස් අධ්‍යාපන ව්‍යාපෘති (HETC) ආධාර වශයෙන් ලැබුණු පරිගණක හා උපාංග ඒකක 31 ක්ද විවිධ පාර්ශවයන්ගෙන් පුස්තකාලයට ලැබුණු පොත් පිටපත් 116 ක්ද වටිනාකම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

64

## 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව හා නිවැරදිව පවත්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් වලින් නිරූපිත වත්කම් වර්ග 05 ක රු.236,394,741 ක් වූ පිරිවැය, රු.21,793,508 ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය, රු.92,848,684 ක් වූ සමුච්චිත ක්ෂය හා රු.143,546,057 ක් වූ ශුද්ධ අගයෙහි නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 හා 1989 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු.51,850 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර ගණනාවක සිට ඉදිරියට ඉඟින් පවතින කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකළ රැඳවුම් මුදල් රු.441,822 ක් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු විදේශ ගමන් සඳහා අත්තිකාරම් රු.79,000 ක් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 5.4.11. වගන්තිය | එකතු කළ අගය මත බදු (වැට් බදු) සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් / සැපයුම්කරුවන් වෙත බදු ඉන්වොයිසි පත්‍රයක් ලබා ගැනීමෙන් පසු එකතුකළ අගය මත බදු ගෙවිය යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 5.4.12 වගන්තිය | එකතු කළ අගය මත බදු (වැට් බදු) ගෙවීම පිළිබඳ විස්තරයක් ඊළඟ මාසයේ 15 දින හෝ එදිනට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) | මුදල් රෙගුලාසි 139 (7) හා 262 (2) | රු. 105,980ක් වටිනා ගෙවීම් වවුචර් 03 ක හා ඊට අදාළ උපයෝගී ලියවිලි වල ''ගෙවන ලදී'' මුද්‍රාව තබා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 231 (1) සහ 138 (6) හා (8) | නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ රු.1,534,475 ක් වටිනා ගෙවීම් වවුචර් 05 කට අදාළ බිල්පත් අමුණා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 394 | මාස 10 සිට වසර 03 ක් ඉක්මවූ රු.443,489 ක් වටිනා අවලංගු කළ චෙක්පත් 62 ක් නැවත ගෙවීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබූ අතර එයින් රු.10,180 ක් වටිනා චෙක්පත් 04 ක් අවලංගු කළ චෙක්පත් ලේඛනය තුළට ඇතුළත් කර නොතිබුණි. |
| (ඇ) | 2014 ඔක්තෝම්බර් 17 දිනැති අංක 02/2004 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 128 | වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු නියමිත කාලරාමුව තුළ සිදුකර නොතිබූ අතර පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ඒකක 1939 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය එම සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඉ) | 1995 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සාමාන්‍ය රාජකාරි වේලාවන් තුළදී බාහිර පාඨමාලා වලට අදාළ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.1,538,000 ක් ගෙවා තිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග සඳහා වූ වත්කම් ලේඛනයෙහි චක්‍රලේඛයට අනුකූලව විස්තර ඇතුළත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ ඌනතාවය රු.9,425,582 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.98,204 ක් වූයෙන් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,327,378 ක පිරිහීමක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ඉඩම් කොටසක් විකිණීමෙන් ලැබුණු රු.25,200,000 ක ලාභය හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.15,774,418 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතු

(i) සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කටයුතුවල යෙදුනු 934 ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා වැයකළ පුනරාවර්තන වියදම රු.296,228,629 ක් වූයෙන් ඒක ශිෂ්‍ය පිරිවැය රු.317,161 ක් වූ අතර ඉකුත් වර්ෂයේ අධ්‍යයන කටයුතුවල යෙදුනු 876 ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා වැයකළ පුනරාවර්තන වියදම රු.223,548,286 ක් වූයෙන් එම වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.255,192 ක් විය.

(ii) ආයතනයේ පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍යයන් 1112 දෙනෙකුගෙන් වර්ෂය අවසාන වනවිට 178 දෙනෙකු හෙවත් සියයට 16 ක් පාඨමාලා හැරගොස් තිබුණි.

(iii) විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පාඨමාලා ව්‍යවස්ථාවලියේ සඳහන් කාලයට වඩා සැලකිය යුතු ප්‍රමාදයක් සිදු කර තිබුණි.

(iv) ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය ලබා ගැනීමේ සුදුසුකම් 2011 වර්ෂයේ සංශෝධිත එම ව්‍යවස්ථාවලියේ ස්ථාන දෙකක දෙආකාරයට සඳහන් කර තිබීම කෙරෙහි විෂයමාලා සංවර්ධන හා ඇගයීමේ කමිටුවල අවධානය යොමු වී නොතිබුණි.

(v) ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවෛද්‍ය උපාධි පාඨමාලා ව්‍යවස්ථාවලියේ ඇතුළත් දේශන පැය ගණන් හා තථ්‍ය දේශන පැය ගණන් සැසඳීමේදී විෂයයන් 09 ක ව්‍යවස්ථාපිත පැය ගණනට වඩා පැය 166 ක් අඩුවෙන්ද විෂයයන් 06 ක පැය 146 ක් වැඩියෙන්ද දේශන පවත්වා තිබුණි.

(vi) ආයතනය තුළ විෂයමාලා සංවර්ධන හා ඇගයීමේ කමිටු 05 ක් ස්ථාපිතකර තිබුණද ඒවා සක්‍රියව ක්‍රියාත්මක වූ බවට සාක්ෂි නොවීය.

### (ආ) පශ්චාත් උපාධි හා බාහිර පාඨමාලා

(i) 1979 දෙසැම්බර් 21 දිනැති අංක 07 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලිය තුළ ආයතනයට පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීමට බලතල ලබාදී නොතිබු නමුත් ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමකින් තොරව ආයතනය විසින් වයර ගණනාවක් තිස්සේ පශ්චාත් උපාධි පාඨමාලා පවත්වා තිබුණි.

(ii) සිසුන් 20 දෙනෙකු ඇතුළත් කර ගනිමින් 2012 මැයි 21 දින ආරම්භ කරන ලද ආයුර්වේද වෛද්‍ය විශාරද 2012/ 2015 තුන් අවුරුදු පාඨමාලාවේ විෂය නිර්දේශය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලා ව්‍යවස්ථාවලියේ 13 (III) ඡේදය පරිදි මාස 06 ක විදේශ පුහුණුවක් ලැබිය යුතු නමුත් මාස 03 ක පුහුණුවක් පමණක් ලබාදී තිබු අතර 13 (I) ඡේදය පරිදි අධ්‍යයන කාර්යසාධනය ඇතුළත්ව අපේක්ෂකයන් සඳහා වෙන වෙනම ගොනුද පවත්වා නොතිබුණි.

(iv) මුදල් අයකර පවත්වනු ලබන පාඨමාලාවන්හි පොදු කාර්ය වියදම, මානව හා භෞතික සම්පත් පිරිවැය රජයේ මුදලින් දරා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයේ සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු ඉඩමක පවත්වාගෙන යනු ලබන පිරිමි නේවාසිකාගාරය පිහිටි ඉඩම අත්පත් කරගෙන ගොඩනැගිල්ල වැඩිදියුණු කර නේවාසිකාගාරයකට සුදුසු තත්වයෙන් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබූ අතර නේවාසිකාගාර උපපාලක තනතුර අහෝසි කර එහි පාලන කටයුතු නඩත්තු පරිපාලකවරයා වෙත පවරා තිබීමෙන් නේවාසිකාගාරයේ පාලනය නිසිලෙස සිදු නොවන බවටත් නේවාසිකාගාර ගාස්තු අය නොකරන බවටත් නිරීක්ෂණය විය. එමෙන්ම එක් උප පාලිකාවක් යටතේ පවත්නා කාන්තා නේවාසිකාගාර 03 ක සහායිකාවන් නොමැති වීම ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව කෙරෙහි බලපාන බවද නිරීක්ෂණය විය.

(ආ) පරිත්‍යාගශීලීන්ගෙන් සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා ලැබුණු මුදල්, එම කාර්ය සඳහා යොදා නොගෙන ස්ථාවර තැන්පතු ගිණුම 04 ක ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.266,361 ක් විය.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති මේස මිල දී ගැනීමේ දී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මිල ගණන් ෆැක්ස් මගින් එවීම නිසා ප්‍රතික්ෂේප කර තිබූ අතර ඒ හේතුවෙන් රු. 75,797ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතුවලට අමතරව ඖෂධ නිෂ්පාදනය කර අලෙවි කිරීමේ පරමාර්ථයෙන් 2012 වර්ෂයේ දී රු. 1,280,000 ක් වැය කර ඖෂධ නිපදවීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබූ නමුත් ඖෂධ නිපදවීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂයේ දී යන්ත්‍ර ස්ථාපිත කිරීම සඳහා විද්‍යාගාරයක් ඉදි කිරීමට ප්‍රථම මිල දී ගත් රු. 319,460ක් වටිනා ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර 04ක් නිෂ්කාර්යයව තිබුණි.

## 4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පශ්චාත් උපාධි අංශයට පූර්ණ කාලීනව අනුයුක්ත කර සිටින වැඩබලන අධ්‍යක්ෂ හා කාර්යය මණ්ඩලයේ තුන් දෙනෙකු වෙත එම කාර්යය වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවා තිබියදී මාසිකව රු. 12,600 ක් බැගින් දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පාඨමාලා ආදායමෙන් රු. 215,800 ක් ගෙවා තිබුණි.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලාවන්හි ප.ව.6.00 න් පසුව දේශන පැවැත්වීම සඳහා සැලසුම් සකස්කර නොතිබූ නමුත් දේශකවරුන් හතරදෙනෙකු විසින් ප.ව.8.00 න් පසුව දේශන පැය 12 ක් පැවැත්වූ බවට ගෙවීම් වවුචර්වල සඳහන් කරමින් රු.15,250 ක දේශන ගාස්තු ලබාගෙන තිබුණි.

(ඇ) ආයතනයේ උපාධි පාඨමාලා සඳහා අනුයුක්ත කථිකාචාර්යවරුන් 43 දෙනෙකු පශ්චාත් උපාධි පාඨමාලාවන්හි දිවා කාලයේ අධ්‍යයන කටයුතු සිදු කර දීමනා ලබා ගෙන තිබුණි.

(ඈ) ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලාවේ සිසුන් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 15 සිට මැයි 15 දක්වා කාලය තුළ විදේශ පුහුණුවක නිරත වීම හේතුවෙන් ආයතනය තුළ අධ්‍යයන කටයුතු හා සම්බන්ධ කාර්යයන් ඉටු නොකළ ද සහාය කාර්යය මණ්ඩලයට එම කාලය සඳහා රු.213,700 ක දීමනා ගෙවා තිබුණි.

(ඉ) 21 වන ශත වර්ෂයට උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතියෙන් ආධාර වශයෙන් ලැබුණු පරිගණක 29 ක් සඳහා එම ව්‍යාපෘතියෙන් මෘදුකාංග ලබා ගැනීමට කටයුතු නොකර, 2003 අංක 06 දරන බුද්ධිමය දේපල පනතේ ඇතුළත් විධිවිධාන නොසලකමින් බලපත්‍ර රහිත මෘදුකාංග පිටපත් යොදා ගෙන පරිගණක ක්‍රියාත්මක කර තිබුණි.

(ඊ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතු සඳහා ඉල්ලුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු. 3,302,059 ක් වටිනා යන්ත්‍ර 18 ක් ඊට වඩා රු. 13,877,984 ක් හෙවත් සියයට 420 ක් වැඩිපුර මිල වූ රු. 17,180,043 ක් ගෙවා මිල දී ගෙන තිබුණි.

4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දර්ශන විශාරද උපාධිය හැදැරීම සඳහා ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වෙත මානව, ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් 2006 හා 2008 වර්ෂයන්හිදී රු.590,000 ක ප්‍රදානයක් ලබාදී තිබුණද එම කථිකාචාර්යවරයා මෙ දක්වාම එම උපාධිය හදාරා අවසන් කර නොතිබුණි.

(ආ) 1979 දෙසැම්බර් 21 දිනැති අංක 07 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියේ 05 (ඇ) ඡේදයේ උපදෙස් පරිදි විශ්ව විද්‍යාලයේ අනුමැතිය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟත්වය ලබා නොගෙන සහතික පත්‍ර පාඨමාලා 03 ක් ආරම්භ කිරීම සඳහා රු.81,900 ක වියදමකින් පුවත්පත් දැන්වීමක් පලකර තිබුණද ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම මත එම පාඨමාලා ආරම්භ කර නොතිබූ අතර ඒ සඳහා දරන ලද වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මැයි මස සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වෙත මාස 04 ක් තුළ දේශන හා ප්‍රායෝගික පැය 10 ක් පමණක් ඉටු කිරීමට පවරා තිබූ අතර එයින් පැය 05 ක පමණක් අධ්‍යයන කටයුතු වල නිරත වී තිබුණි. එම කාලය සඳහා රු.539,634 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්

2003 ජූනි 02 දිනැති අංක පිඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරව ආයතනයේ සම්කරු තනතුරකට බඳවා ගත් අයෙකු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මුදා හැර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු. 391,459 ක වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට 217 ක් වූ අනුමත මුළු කාර්ය මණ්ඩලයේ තනතුරු 29 ක් පුරප්පාඩු වී පැවති අතර පැවරුම් පදනම මත හා පුහුණුවන්නන් 16 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

4.8 වාහන උපයෝජනය

ආයතනය සතු වාහන 04 ක් සඳහා ධාවන සටහන් හා ලොග් පොත් අසම්පූර්ණ ව පැවතීම, ඉන්ධන ඇනවුම් ලේඛනයක් නොපැවතීම, ඉන්ධන ගැලපුම් හා ධාවනය කළ කිලෝමීටර් ගණන් ධාවන සටහන්හි නිවැරදිව ඇතුළත් නොකිරීම යන කරුණු නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික අත්‍යවශ්‍ය අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් රු.42,913,000 ක් වූ කාර්යයන් 33 ක් අතුරෙන් ඇස්තමේන්තුගත වටිනාකම රු. 20,100,000 ක් වූ කාර්යයන් 14 ක් ඇතුළු කාර්යයන් 22 ක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර සැලසුම් නොකළ රු.5,897,184 ක් වටිනා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්යයන් 05 ක් කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ වූ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 4.2.2 හා 4.2.6 වගන්තිවල උපදෙස් පරිදි කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

පුනරාවර්තන වැය විෂයයන් 03ක රු.204,915,000 ක් වූ අනුමත ප්‍රතිපාදනය රු.8,783,463 කින් හෙවත් සියයට 4 කින් සහ ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක රු.32,500,000 ක් වූ අනුමත ප්‍රතිපාදනය රු.15,546,265 කින් හෙවත් සියයට 48 කින් ඉක්මවා වැය කර තිබූ අතර ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කළ රු.9,400,000 ක් වූ මුළු ප්‍රතිපාදනය සහ නවත් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කර තිබූ රු.18,100,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු.9,855,061 ක් හෙවත් සියයට 54 ක් උපයෝගී කර නොගැනීමද යන කරුණු හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

- විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුමකරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) තොග පාලනය
(ඉ) අත්තිකාරම්
(ඊ) ප්‍රසම්පාදන කටයුතු
(උ) ශිෂ්‍ය අධ්‍යයන කටයුතු
(ඌ) නේවාසිකාගාර පාලනය
(එ) වාහන පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

72

2.2.1 (අ)(ආ) මෙම තත්ත්වය ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.

2.2.2.(අ) රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ඒ මඟින් මෙම තත්වය නිවැරදි කරනු ලැබේ.

(ආ)(ඇ)මෙම අඩුපාඩු නිවැරදි කර ඇත.

2.2.3 දැනට විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමේ කටයුතු අවසන් කෙරෙමින් පවතින නිසා මෙම දෝෂ නිවැරදි කිරීමට පියවර ගනු ඇත.

2.3 (අ) මෙම විගණන ගාස්තු ගෙවීම් කර ඇත.

(ආ)රැඳවුම් මුදල් සම්බන්ධ නිවැරදි කිරීම් සිදුකර ඇති අතර විදේශ ගමන් අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් උපදෙස් පතා ඇත.

2.4 (අ) (i)(ii)බදු ඉන්වොයිස් පත් ලබා ගැනීම සඳහා ඉදිරියේදී පියවර ගනු ලබන අතර අදාළ වාර්තා කිරීම් විගණකාධිපති හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත සිදු කර ඇත.

(ආ) (i) මෙම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(ii)විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් යනාදී ආයතන සඳහා ගෙවීම් කිරීම සඳහා මෙම බිල්පත් වවුචරයෙන් ඉවත් කර ඇති අතර මෙවැනි අවස්ථාවල දී ඡායා පිටපත් ඇමිණීමට උපදෙස් ලබා දී ඇත.

(iii)මෙම තත්ත්වය නිවැරදි කර ඇත.

(ඇ) 2015 වර්ෂය සඳහා නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇත.

(ඈ) මෙම පරීක්ෂාවන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(ඉ) මෙම කාර්යයන් සාමාන්‍ය රාජකාරිවලට බාධානොවන ආකාරයට ඉටුකර ඇති අතර අදාළ අනුමැතියන් ලබා ගැනීමට උපදෙස් ලබා දී ඇත.

(ඊ) මේ පිළිබඳ පරීක්ෂා කර අදාල වෙනස්කම් කිරීමට උපදෙස් ලබා දී ඇත.

4.1 (අ)(i)මෙම වර්ෂයේ දී ශිෂ්‍ය සංඛ්‍යාවේ වැඩිවීම මත ඊට අනුකූලව සමස්ත වියදම් වැඩිවීම හා විශේෂයෙන් වර්ෂය තුළ වැටුප් වැඩිවීම් කිහිපයක් සිදුවීම නිසා මෙම තත්වය පැන නැගී ඇත.

(ii) 2013ට සාපේක්ෂව පාඨමාලා හැර යාම අඩුවී ඇති නිසා මෙහි වර්ධනයක් පෙන්වනු ලැබේ.

(iii) බාහිර කථිකාචාර්යවරුන්ගෙන් ප්‍රතිඵල ලේඛන ලැබීම ප්‍රමාද වීම මත මෙම තත්ත්වය පැන නැගි ඇති අතර මෙය දියුණු කිරීමට පියවර ගනු ලැබේ.

(iv) මෙය මුද්‍රණ දෝෂයක් බැවින් නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

(v) මෙහි නිවැරදි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත.

(vi) මෙම කමිටු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පත් කර ඇත.

(ඇ)(i) ව්‍යවස්ථා සංශෝධනය සඳහා ආයතනයේ කළමනාකාර මණ්ඩලය මඟින් අචාර්ය භවතුන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර එම කටයුතු සිදුකිරීමට පියවර ගෙන ඇත.

(ii)අදාළ අනුමැතිය ලබා ගෙන ඇත.

(iii)ආයතනයේ මුල්‍ය තත්ත්වය සලකා බලා කළමනාකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව මෙය සිදුකර ඇති අතර අදාල ප්‍රගති වාර්තා පශ්චාත් උපාධි අංශය සතුව පවතී.

(iv) ඉදිරි අධ්‍යයන වර්ෂවලදී මේ සඳහා නියමිත ප්‍රතිපාදන ඇති කිරීමට පියවර ගනු ලැබේ.

4.2 (අ) අදාළ වැඩිදියුණු කිරීම් දැනට ආරම්භ කර ඇති අතර අනිකුත් අඩුපාඩු සියල්ල නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ආ) මෙම ගිණුම් සියල්ල ඒකාබද්ධ කර එක් ශිෂ්‍යත්ව ගිණුමක් ආරම්භ කර ඇති අතර ඉදිරියේදී අරමුදල වර්ධනය වූ පසු ශිෂ්‍යත්ව ලබා දිමට කටයුතු කරනු ලැබේ.

4.3 (අ) සිමෙන්ති මේස මිලදී ගැනීම සඳහා මුද්‍රිත මිල කැඳවුම් ක්‍රමය භාවිතා කිරීකම හේතුවෙන් රාජ්‍ය ආයතනයක් වුවද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් ලැබු මිල කැඳවුම් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇත.

(ඇ) ඖෂධ නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපෘතිය කළමනාකාර මණ්ඩලය මඟින් අනුමත කර ඇති අතර ඉදිරි වර්ෂයේදී එම කටයුතු ආරම්භ කරනු ලැබේ. මෙම යන්ත්‍ර සියල්ල දැනට ක්‍රියාත්මක වන අතර අදාල අත්හදා බැලීම් සිදු කරනු ලැබේ. මීට අමතරව බොරැල්ල ආයුර්වේද රෝහලේදී හා ආයතනයේ සෞඛ්‍යය මධ්‍යස්ථානය තුළදී රෝගීන්

පරීක්ෂාවක් කරනු ලැබේ. එමෙන්ම ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීමද සිදු කරනු ලැබේ.

4.4.(අ) අදාල පශ්චාත් උපාධි අයවැය ලේඛනවල මෙම ගෙවීම ඇතුළත් කර ඇති අතර ඔවුන් අදාළ පාඨමාලාවේ කාර්යයන් ඉටු කිරීම හේතුවෙන් ගෙවීම් කර ඇත.

(ආ) මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීමට උපදෙස් ලබා දි ඇත.

(ඇ) සාමාන්‍ය උපාධි පාඨමාලා අධ්‍යයන කටයුතුවලට බාධා නොවන පරිදි මෙම අධ්‍යයන කටයුතු සිදු වී ඇත.

(ඈ) මෙම කාලය තුල සහාය කාර්ය මණ්ඩලය සඳහා පාඨමාලාවේ සාමාන්‍ය කටයුතු ඉටුකිරීමට සිදු වී තිබීම නිසා මෙම ගෙවීම කර ඇති අතර අදාළ අපේක්ෂිකාව මේ වන විට එම විදේශ පුහුණු කටයුතු නිම කර ඇත.

(ඉ) අදාළ ව්‍යාපෘතිය මඟින් ආධාර ලෙස මෙම මෘදුකාංගය නොලැබීම මත මුදල් ගෙවීමකින් තොරව මෙම පිටපත් ලබා ගෙන ඇත.

(ඊ) නිවැරදි යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට නොහැකි වීමෙන් යන්ත්‍රවල ඇස්තමේන්තුගත මුදල අඩුවෙන් සඳහන් වී තිබුණු නමුත් විවෘත මිල කැඳවුම් ක්‍රමය භාවිතා කිරීම හේතුවෙන් නියමිත භාණ්ඩ වෙළඳ පොළේ පවතින අඩුම මිලට මිලදී ගැනිම සිදුවී ඇත.

4.5 (අ) මේ සඳහා අදාළ ආයතනයෙන් උපාධිය අවසන් කිරීමේ කාලය දීර්ඝ කිරීමක් ලැබී ඇත.

(ආ)ආයතනය විසින් අරමුදල් ස්වයං ජනිත කර ගැනීමේ කාර්යය සඳහා උත්සාහයක් මෙයින් සිදු කර ඇති අතර ඉදිරි වර්ෂයේදී මෙය තවදුරටත් සාර්ථක කර ගැනිමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මේ පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීමට උපදෙස් ලබා දී ඇත.

4.6 මෙම සේවිකාව දැනට ආයතනයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වී ඇත.

4.7 මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය සියලු කටයුතු ඉටුකර ඇත

4.8 මෙම කරුණු සියල්ල වර්තමානයේ නිවැරදි කර ඇත.

5.1 (අ) මේ කරුණු සියල්ල ඇතුළත් කර ඉදිරි ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ආ) ස්ථිර වැඩ ඉංජිනේරුවරයෙකු නොමැති විම හේතුවෙන් පිටතින් සේවාවන් ලබා ගැනීමේදී සිදු වු දුෂ්කරතා හේතුවෙන් මෙම යටිතල පහසුකම් සැපයීමේ කාර්යවල ප්‍රමාදයන් සිදුවී ඇති අතර ඉදිරි වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට මෙම කාර්යයන් සියල්ල ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී ඇත. ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු මේ

වන විටත් ආරම්භ කර ඇති අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වාදීමට යෝජිත වූ තොරතුරු පද්ධතිය හේතුවෙන් ශිෂ්‍ය තොරතුරු පද්ධති ව්‍යාපෘතිය නවතා දමන ලදි. ශිෂ්‍ය උද්සෝෂණ හේතුවෙන් වැසිකිළි පද්ධතිය හා අනිකුත් දෙපාර්තමේන්තු අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට සිදු වී ඇති අතර 2014 දෙසැම්බර් පැවැති ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ අවශ්‍යතා සඳහා මාර්ග පද්ධතිය සකස් කිරීමට සිදුවිම හේතුවෙන් සැලසුම් නොකල කාර්යයන් කිහිපයක් වර්ෂය තුල ඉටු කිරීමට සිදු විය. මෙම ව්‍යාපෘති වටිනාකම් සියල්ල 2014 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාව තුල සිදු කර ඇත.

(ඇ) අදාළ සියලු කාර්යය සාධන වාර්තා සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.

5.2 අවස්ථා කිහිපයකදී සේවක වැටුප් වැඩිවීම, ආරක්ෂක වියදම් ඉහළ යාම හා වෙළඳ පොළ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 03ක 4.7% ක අනුමත ප්‍රතිපාදන ඉක්මවීමක් දක්නට ලැබෙන නමුත් තවත් වැය විෂයන් කිහිපයක අනුමත ප්‍රතිපාදනයට අඩුවෙන් වැයවීම මත මෙය තුලනය වීමක් සිදු වී ඇත. ප්‍රාග්ධන වැය විෂයන්වලදී ද සේවක හිඟතාවය, අනපේක්ෂිත සිදුවීම් ඇතිවීම් හේතු කොටගෙන අනුමත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සුළු විචලතා සිදු වී ඇති අතර ඉදිරියේදී මෙම කාර්ය පාලනය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

6. මෙම කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කර අඩුපාඩු සකස් කර ගැනිමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

...........................................

වෛද්‍ය එස් . ඩී. හපුආරච්චි

අධ්‍යක්ෂ,

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,

රාජගිරිය.